# පැරණි කෙම් ක්‍රම කීපයක් හා ඒවායේ භාවිතය පිළිබඳ අන්වේෂණයක්

**වයි.කේ. තිස්ස බණ්ඩාර**

## හැඳින්වීම

කෙම් යනු ක්ෂේමය, ආරක්ෂාව, රෝග නිවාරණාදිය සඳහා කරන ක්‍රියාව යි. පූජ්‍ය පණ්ඩිත වැලිවිටියේ සෝරත හිමියෝ ශ්‍රී සුමංගල ශබ්දකෝෂයෙහි එසේ සඳහන් කරති. ඒ අනුව ආරක්ෂාව සඳහා දේශනා කරනු ලබන සහ අසනු ලබන පිරිත් දේශනා ද එක්තරා කෙම් ක්‍රමයක් විය හැකි ය. සාමාන්‍යයෙන් පිරිත් දේශනා කිරීම වරු පිරිත, සර්ව රාත්‍රික, තුන්තිස් පැය, සති, ආදි වශයෙන් සිදුකරනු ලැබේ. ඒවාට අමතරව ගුප්ත ශාස්ත්‍රය අනුව ද පිරිත් ආරක්ෂක මන්ත්‍ර සේ භාවිත කිරීමේ ක්‍රමයක් අප සමාජයේ තිබෙයි. පිරිත් බලයෙන් තුන්බිය සමනය කිරීම බුදුන්වහන්සේ ධරමාන සමයෙහි දී සිදු වූ බැවින් එ බඳු ආරක්ෂක විධික්‍රම සුළු කොට තැකිය නොහැකි ය. මේ පිළිබඳ ව විස්තර චතුභාණවාරපාළි අට්ඨකථාවෙහි මැනවින් දැක්වෙයි. ගුප්ත විද්‍යාව තුළ බොහෝ කෙම් ක්‍රම තිබෙන බව පිළිගැනෙයි. ඒවා යන්ත්‍ර මන්ත්‍ර ගණයට අයත් වන්නේ ය.

කෙම් ක්‍රම සඳහා භාවිත කළ බොහෝ ශිල්ප ක්‍රම මුඛ පරම්පරාවෙන් පවත්වාගෙන ඒම සහ ලේඛනාරූඪයෙන් පවත්වාගෙන ඒම යන දෙ ආකාරයෙන් ම සිදුව තිබෙයි. මේවායෙන් ඇතම් ඒවා අභාවයට පත්වන්නට ඇතැයි පිළිගැනීමට පුළුවන් ය. වර්තමානයේ දී පැරණි කෙම් ක්‍රම භාවිත කිරීම සිදුවන අවස්ථා ද තිබෙයි. මිනිසාට වැළඳෙන ඇතැම් රෝග නිවාරණ කරනු පිණිස කෙම් ක්‍රම අනුගමනය කිරීම අප සමාජයේ



දක්නට ලැබෙයි. ගෘහාශ්‍රිත කළ ගව සහ අලි ඇත්තුගෙ රෝග සඳහා ද කෙම් ක්‍රම භාවිත කිරීම එම සත්ත්ව පාලනය ආශ්‍රයෙන් වාර්තා වෙයි. පැරණි කෘෂිකාර්මික සමාජයේ කෘෂි රෝග පාලනය වෙනුවෙන් භාවිත කෙම් ක්‍රම රැසක් දැනට විවිධ කෘති අනුසාරව පළව තිබෙයි.

මෙහි සංස්කාරක හිමිවරු පැරණි **කෙම් ක්‍රම** ආශ්‍රයෙන් ලිපියක් සම්පාදන කිරීමට අපට ඇරයුම් කළහ. ඉන් හැඟී ආයේ දේශීය මෙන් ම පාරම්පරික අපේ උරුමයට උන්වහන්සේගේ ඇති ළැදියාව යි. මහාචාර්ය පූජ්‍ය අලහේනෙගම සුමනරතන හිමිපාණෝ ද අප දන්නා පරිදි පාරම්පරික ගරු වෙදහිමි නමකගේ ශිෂ්‍ය යතිවරයාණ කෙනෙක් වෙති. ප්‍රස්තුත හිමිපාණෝ ආහවහනීය ඇදුරුතුමෙක් වන්නාහ. එබැවින් මෙබඳු ගතකින් අභිනන්දනයට උන්වහන්සේ ආහුනෙය්‍ය වෙති. ඒ වෙනුවෙන් අප ලද අවස්ථාව ආහ්ලාද වන්නේ ය.

## ක්‍රමවේදය

මෙම ලිපිය සම්පාදනය කිරීම සඳහා පැරණි පුස්කොළ පිටපත් කීපයක අන්තර්ගත කෙම් ක්‍රම, යන්ත්‍ර, මන්ත්‍ර භාවිත කරනු ලැබෙයි. ඒවා **නොච්චියාගම බෝගහවැව** පදිංචිව සිට මීට වසර 58 කට පෙර අභාවප්‍රාප්ත **සුද්දහාමි වන්නිනායක දිසානායක** වෙද මහතාට අයත්ව තිබී එම පරපුරේ අය විසින් වර්තමාන ලියුම්කරුට දෙන ලද ඒවායෙන් සහ **මැදවච්චිය පිහිඹියගොල්ලෑව** ගමේ **ආරියරත්න** හා **කරුණාරත්න** යන මහත්වරු විසින් දෙන ලද පුස්කොළ පොත් ආශ්‍රයෙනි. එයට අමතරව මුද්‍රිත කෘති කීපයක අන්තර්ගත කෙම් ක්‍රම, යන්ත්‍ර, මන්ත්‍ර යම් ප්‍රමාණයක් ද ආශ්‍රය කරගනු ලැබෙයි. ඒ සියල්ල සඳහා අදාළ මූලාශ්‍රය නිසි ස්ථානවල යෙදෙයි.

## අරමුණ

පුරාණ කෙම් ක්‍රම හා ආරක්ෂක විධි ක්‍රමවලට අයත් අභිචාර අතුරෙන් සීමිත කොටසක් මෙයින් එළි පැහැදිලි කිරීම මෙහි මූලික අරමුණ වන්නේ ය. ඒ අනුව තෝරාගත් කරුණු කීපයකට අදාළ නිදසුන් කීපයක් මෙයින් හඳුන්වා දෙනු ලැබෙයි.

**සාරාංශය**

කෙම් ක්‍රම එක්තරා අභිචාර විධියක් වශයෙන් ද සැලකෙයි. අභිචාර ගැන අදහස් දක්වන පියසේන කහඳගමගේ මහතා මෙසේ සඳහන් කැර තිබෙයි. "අභිචාර" යන වදනට අර්ථ නිරූපණය කරන පූජ්‍ය පණ්ඩිත වැලිවිටියේ සෝරත හිමියෝ 'කොඩිවින කිරීම' යන තේරුම ඉදිරිපත් කරති. එහෙත් වර්තමානයේ මෙම වචනය තොවිල් පවිල් යන්ත්‍ර මන්ත්‍ර හදි හූනියම් අනවින කොඩිවින බලියාග සෙත් ශාන්ති ආදි වශයෙන් පැතිරී ඇති ගුප්ත විද්‍යා සීමාව ම ආවරණය කිරීමට යොදනු දැකිය හැකි ය. එහෙයින් මා අභිචාර විධි යන වචනය භාවිත කරන්නේ සෝරත හිමියන් ගේ අර්ථ නිරූපණයට වඩා පළල් සීමාවක සිට 'ගුප්ත විද්‍යාවන් ' යන අදහස මතුවන පරිදි බව වටහා ගැනීම මැනවි" යනු යි. ප්‍රවීණ ජනශ්‍රැති පර්යේෂකයෙකු වූ පියසේන කහඳගමගේ මහතා මේ ගැන මෙසේ ද සඳහන් කැර තිබෙයි.

"කෙම් ක්‍රම සැලකිල්ලට ලක් කරන විට පෙනී යන ප්‍රධාන කාරණයක් වන්නේ වැඩි ප්‍රමාණයක විද්‍යාත්මක පදනමක් ඇති බව ය. පදනමක් ඇති උපායකින් පලිබෝධ නාශක කටයුත්ත කෙරෙන කෙම් ක්‍රම පෙර සාකච්ඡා කෙළේ එවැනි කෙම් ක්‍රම ගැන ය. මන්තර සම්බන්ධ වූව ද උපායන් හඳුනාගත හැකි කෙම් ක්‍රම ද ඉහත කී ගණයේ ලා සැලැකුණු බව ඔබ දන්නෙහි ය. අප රැස්කර ගත් කෙම් ක්‍රම අතර උපායන් හඳුනාගත නොහැකි අභිචාර විධි මත ම පදනම් වූයේ යයි සිතියි හැකි කෙම් ක්‍රම රාශියක් ද ඇත. ඒවා ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැකි ය.

I. යන්ත්‍ර
II. මන්ත්‍ර

යනුවෙන් අපි ඒවා සරල ලෙස වර්ග කර ගනිමු." යනු යි.

මෙහි දී අප විසින් පොදුවේ කෙම් ක්‍රම, යන්ත්‍ර, මන්ත්‍ර, හදිහූනියම්, ඉනා සහ වශී ගුරුකම් මෙන් ම ආරක්ෂක විධික්‍රම කීපයක් මෙයින් හඳුන්වා දෙනු ලැබෙයි.



**ගර්භණී චිකිත්සාව**

ලාංකේය දේශීය වෛද්‍ය ශාස්ත්‍රයෙහි දැනුම සංරක්ෂිත පුස්කොළ අත්පිටපත් බොහොමයක ගර්භණී චිකිත්සා යටතේ කෙම් ක්‍රම තිබෙයි. රෝගියාට භෞතික වශයෙන් ඖෂධ කිසිවක් සිරුරට නොදී අභිචාරවිධි ක්‍රමයකින් ප්‍රසව වේදනා සමනය කිරීමත්, දාරක ප්‍රසූතිය පහසු කිරීමත්, වැදැමහ බිහිකිරීමත් මෙන් ම කුස තුළ මළ දරුවා බිහිකරවා ගැනීමත් මේ අනුසාරව සිදුකරගෙන තිබෙයි. මේවා ආයුර්වේද හෝ වෙනත් වෛද්‍ය ශාස්ත්‍රයකින් හෝ ආභාස ලබා පරිණාමයට පත්වූ ක්‍රමයක් ද එසේත් නැතිනම් දේශීය වශයෙන් ප්‍රගුණ කළ ඒවා ද යනු වෙන ම සෙවිය යුතු වෙයි. ආයුර්වේදයට අයත් සුශ්‍රැත සහ චරකසංහිතාවෙහි දැක්වෙන පරිදි කුස දී මළ දරුවා බිහිකරවා ගැනිමට එම සිරුර අවියකින් කැබලිවලට කපා ඉවත්කිරිමට උපදෙස් දී තිබෙයි. එහෙත් ලාංකේය දේශීය වෛද්‍ය ශාස්ත්‍රයට අනුව කුස තුළ මියගිය දරුවා මන්ත්‍රයෙකින් හෝ කෙම් ක්‍රමයෙකින් බිහිකරවා ගැනීම සිදුව තිබෙයි. ගර්භිණී චිකිත්සාවට අයත් මහසම්මත ගර්භවිධිය නමින් යුත් පැරණි පුස්කොළ පිටපතක් වර්තමාන ලේඛකයාට ලැබිණ. එයට අදාළ කෙටි විස්තරයක් මීට ප්‍රථම පළ කරන ලදී.[1] එම පිටපතේ ගර්භිණී චිකිත්සාවට අදාළ ව බොහෝ වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම සහ ඖෂධ දක්වා තිබිණ. ඒවාට අමතර ව කෙම් ක්‍රම කීපයක් ද විය. ඒවා විවිධ වෙයි. මේවායෙන් ඇතැම් ඒවා ආයුර්වේද ග්‍රන්ථවලින් ආභාස ලබා ඇති බවට සාධක ද තිබෙන අතර ඇතැම් ඒවා දේශීය කෙම් ක්‍රම ද විය හැකි ය. ඉන් කීපයක් මෙසේ ය.

**වැදුන් පරක්කුවට**

ගර්භයා ඉස්ගැන සිටින වේලාවට ගොඩමානෙල් යෝනියේ පාත තබනු විගස වදත් ... මීටම **ඕං නමෝයේල ගුරුවානේස්වඃ**

1 කෘතවේදී; පියදාස රණසිංහ අභිනන්දන කලාපය (2014), පුස්තකාලවිද්‍යාව සහ විඥාපනවිද්‍යාව අධ්‍යයන අංශය, සංස්කාරක ලගුම්දෙනියේ පියරතන හිමි. කැලණිය විශ්වවිද්‍යාලය. අප්‍රකට පුස්කොළ පිටපතකින් හෙළිවන ගර්භිණී චිකිත්සාව. වයි.කේ. තිස්ස බණ්ඩාර. පිටු. 274 - 288

... මේ මන්ත්‍රයෙන් වතුර මතුරා ඉසිනු ... වදත්.[2] ... ආඩතෝඩා මුල්, ඉඟි මුල්, පාවට්ටා මුල්, දියතිත්ත මුල් මේකීවා එක එක ඇල්දියෙන් අඹරා යටිපල්ලේ හෝ පෙකනියේ ගානු වදත් ... මිනී හිස්කබල දෙහි ඇඹුලෙන් ගලගා යටිපල්ලේ ගානු ... වදත්.[3] ...

**වදන්ඩ බැරුවාට**

ඉඟි මුල්, පාවට්ටා මුල්, දියතිත්ත මුල්, සියඹලා පළු ඉස්මෙන් අඹරා යෝනියේ හා යටිපතුලේ ගානු බිහිවෙයි. මීට ම අඟුණ මුල්, වැල්මී, සැබෝවැල් ඇල්දියෙන් අඹරා යෝනියේ අතපයේ ගානු බිහිවෙයි.[4] ඉර රාහු අල්ලූ දා නියඟලා අලේ උදුරා තියා වදන්ඩ බැරිවිට දියෙන් උරච්චිකොට යටිපල්ලේ ගානු. වැදූ විට සෝදා හරිනු.[5] වංගෙඩිය දොරකඩ සිට දකුණට ගේ වටට පෙරලා දොරකඩ සිටුවා තෝර ගහ උදුරා වනට ලා පොල්කටුවෙන් වසා මෝලෙන් එකපාර පොල්බෑව පිපිරෙන්ඩ කොටනු වදත්.[6] ඉරමුසු මුල් කථා නොකර පිටතියං උදුරා දොරකඩ හිට හත්පියවරක් මැන එතන වංගෙඩිය ගොඩනගා බෙහෙත දමා තුන්පාරක් කොටනු. වදත්.[7] ඌරල මුල් අඹරා අතුල් පතුල්වල ගානු වදත්. තෝර ගහක් උදුරා මුල උඩු අතට හරවා දක්වනු වදත්.[8]

**වදන්ඩ බැරුවාට මන්තරේ**

ඕං නමෝ සිද්ධාර්ථ කුමාරයෝ උපංවන දිනයෙහි මහීකාන්තාව දෙස්කී හෙයින් කලුගල් රුයියා නො මළ හෙයින් අහසේ වැඩ සිට පොලොවේ වැඩ සිට බඩරත්නයා බිහිවෙන් පුතා බිහිවෙන් මෙහි ක්‍රමය නම් එකසිය අට වරක් තෙල් මතුරා බඩේ ගානු. බිහිවෙයි. අත්දුටුවයි.[9]

2 **මහාසම්මත ගර්භවිධිය.** බෝගහවැව පුස්කොළ පිටපත පත්ඉරුව 'ක' දැනට මෙම පිටපත වර්තමාන ලේඛකයා සතුව තිබෙයි.

3 එම. පත්ඉරුව 'කා'

4 එම. පත්ඉරුව 'බෟ'

5 එම. පත්ඉරුව

6 එම.

7 එම. පත්ඉරුව 'බෟ'

8 එම. 'ඩී'

9 එම. 'බෟ'



**මළ දරුවෝ වැටෙන්ඩ**

නියඟලා අල මී පැණියෙන් අඹරා නාබියේ යටිපල්ලේ යටිබඩේ ඉසමුදුනේ ගානු සැනෙකින් වදයි. සෝදාහරිනු. උතුරට ගිය එඬරු මුල උදුරා වින්නබු ගෑනිගේ අතට ගෙන දෝත පානු වැටෙත්.[10] එම මුල තුන් පොටක් මුදු හිරුව තනා වින්නබු ගෑනිගේ ඇඟිල්ලට දමා දෝත පානු. වැටෙයි.[11] නියඟලා අල සහිඳලූනු මීයෙන් ගලගා නාබියේ ඉස්මුදුනේ යටිපතුලේ ගානු එවෙලේ ම වදයි. නැගෙනහිරට ගිය පුහුල් මුලක් උදුරාගෙන ඉසේ බදිනු. වැටෙයි.[12] මෙහි තව ද කෙම් ක්‍රම ඇත. කහ තිප්පිලි ඇල්දියෙන් අඹරා යටිබඩේ ගෑම. එලබිංතඹුරු මුල් අඹරා ගෑම. බැම්තිරිය එළඟිතෙලින් අඹරා බඩේ ගෑම. සාබෙටි ඇල්දියෙන් අඹරා යටිපල්ලේ ගෑම යනු ඉන් කීපයකි.

මේ බඳු කෙම් ක්‍රම පුරාණයේ දී තවත් තිබුණ බවට සාධක තිබෙයි. දැනට පැරණි පුස්කොළ පිටපත් ඇසුරෙන් අනුලේඛනය කොට මුද්‍රණයෙන් එළි දක්වා ඇති සමහර කෘති කෙරෙන් මෙය පැහැදිලි වෙයි. ඒවා කීපයක් ගර්භණී චිකිත්සාවට අදාළව තව ද නිදර්ශනය කරමු. ඒ මෙසේ ය. බුද්ධදාස මහරජතුමන්ගේ වෛද්‍යක සාරාර්ථසංග්‍රයේ සඳහන් පරිදි ප්‍රසව වේදනාව හරණය සඳහා වූ කෙමක් මෙසේ ය. මිනී හිස්කබල් කෑල්ලක් හෝ නියඟලා අලයක් තන කිරෙන් ගලගා ගර්භණීයගේ නාභියේ හා දෙපතුලේ ආලේප කළයුතුයි. ඒ ගැබිණිය සුවසේ බිළිඳා බිහිකරන්නී ය. ඒ විගස සෝදා හැරිය යුතු වෙයි.[13]

සිංහල යෝගරත්නාකරයේ පද්‍යයකින් මේ සඳහා කෙමක් දැක්වෙන්නේ මෙසේ ය.

10 **මහාසම්මත ගර්භවිධිය.** බෝගහවැව පුස්කොළ පිටපත පත්ඉරුව 'ක' දැනට මෙම පිටපත වර්තමාන ලේඛකයා සතුව තිබෙයි. 'බෙ'

11 එම. 'කා'

12 එම. දෙවනිපැත්ත.

13 **බුද්ධදාස මහරජතුමාගේ වෛද්‍යක සාරාර්ථසංග්‍රහය**, ප්‍රතිසංස්කාරක, අචාර්ය කුමාරසිංහ, (1987) ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, කොළඹ. පි. 205.

උදුරා තුවරගස මුල උඩ අග බිමට
අල්වා ගොසින් එලෙස පෑව ගැබිණියට
නිදුකින් වදයි යෙති නිසකින්ම එමවිට
උතුමන් විසින් තෙපලන බසකි පෙරසිට.[14]

වෙදගැටයක් සමග නොතේරෙන බසින් තවත් කෙමක් සඳහන් වන්නේ මෙසේ ය.

අට තුන සතර එක පය නවයත් සයෙක
සතදෙක ලියා දැක්වෙන් යම් පෝරුවක
ගොන් ඉසවත් යමකින් ඇඳ පෑ කලෙක
වහා වදයි යෙත් නිදොකින් නොවී සැක.[15]

පැරණි පුස්කොළ පිටපත් අනුලේඛනය කොට ශ්‍රී ලංකා රජයේ ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් **තල්පතේ පිළියම්** මැයෙන් පොත් පෙළක් එළි දක්වා තිබෙයි. ඒවායේ ද මෙම විෂය හා බැඳි කෙම් ක්‍රම සඳහන් වෙයි. එයින් කීපයක් මෙහි දක්වනු ලැබේ.

**දරු බිහිවීමට**

පෙනලවැලේ මුලයි පිටවක්කා වැලේ මුලයි මුදුහිරුව තනා මාපොට ඇඟිල්ලේ දමනු. වසූරිය බෝවිච්චි මිනී ඉස ගෙන පොල් කිරෙන් ගලගා ඉස මුදුනේ යටි පතුලේ ගානු.[16] පොල්ගෙඩියක් ගෙන කහදියෙන් නාවා දුම්මල අල්ලා දොරකඩ සිට මතුර පිටිහේනට විසිකර මතුර මතුර නැවත ගෙන ආතුරයා ඉදිරිපිට තබා කැත්තට මතුරා ආතුරයා අතට දී බිඳින්ඩ කියනු. විනාඩි තුනෙන් බිහිවෙයි.[17] දරු බිහිවෙන්ඩ පළමුකොට රන් තැඹිලි ගෙඩියක් ඇස්ස ගසා මේ මන්ත්‍රයෙන් මතුරා එයින් වතුර ටිකක් මූනට ඉසිනු.[18] තැටියකට කහදිය ගෙන දෙහි තුනක් දමා ගිනි අඟුරක් බිඳ මොලංකඩ දපා තැටිය ඇතුල්පැත්ත පිට තියා උල්කටුවෙන් සත් විටක් මතුර ඒ දෙහි ගෙන එකක් තළලේ තියා, එකක් බඩේ තියා එකක් දෙපතුල තියා කපනු සැනෙන්

14 සිංහල යෝග රත්නාකරය, රජයේ ආයුර්වේද දෙපාර්තමෙන්තුව (1997) කොළඹ. පද්‍ය අංකය 494,

!5 එම. පද්‍ය අංකය, 496

16 **තල්පතේ පිලියම්.** **කාණ්ඩය** 12. (1993) ආයුර්වේද දෙපාර්තමේන්තුව, පිට 40

17 එම. පිට. 54

18 එම.



බිහිවෙයි.[19] කිකිලි බිජු තුනක් ගෙන මේ මන්ත්‍රය දොරකඩ සිට මතුරා යක්ෂ දිෂ්ටි හැර තුන්විටක් මතුරා පිටිහේනට විසිකරනු. පලේකොටුවක් බැම්ම කපනු යක්ෂ දිෂ්ටි හැර රුදාව තද වෙයි.[20] පොල්ගෙඩියක් ගෙන සුද ඇතුව කඩුල්ල මුල දපා දස විටක් මතුරා උප්පතේ ගා තුඩුගෙන ඉහළට හරවා අතට දී අල්ලනු බිහිවෙයි, දෙහි ගෙඩි තුනක් පිටිහේනේ දපා මතුරනු. පලේ දිග බිමට පෙරලා බැස ඇවිත් එකක් නළල පිට තියා කපනු, එකක් බඩේ තියා කපනු, එකක් දෙපතුලේ තියා කපනු.[21] තලතෙල් ගෙන පළමු කී පරිදි තුන්විටක් මතුරා ඉසේ කම්මුල් දෙකේ ගානු සැනෙන් බිහිවෙයි. සුදු කුකුලෙක් ගෙන ආතුරයාට අල්ලගන්නට දීලා මේ මන්ත්‍රයෙන් තුන්විටක් මතුරා උඩ විසිකරනු බිහිවෙයි, අත්දුටුවයි. රතු කුකුලෙකු ගෙන තුන් නූලක් ගෙන ආතුරයාගේ මාපොට ඇඟිල්ලේ බැඳ කුකුලාගේ පයේ බැඳ දොරකඩ දපා මේ මන්ත්‍රයෙන් කුකුලාට මතුරනු කුකුලා උඩ විසිකරනු බිම වැටෙන කොට වදයි. පොල්ගෙඩියක් ගෙන පිටිහේනේ දපා මන්ත්‍රයෙන් සත් විටක් මතුරා නැවත ගෙන මෝලන්කඩ දපා සත්විටක් මතුර වට තුන් වටල්ලක් ඇවිද පසුව එළිපත පිට තබා බිඳිනු. සිහිවෙයි.[22] මී ගසට ගිය පෝටා කොළත් එම ගහේ පොතුත් මුවෙන් නො බැන ගෙන දොරකඩ වංගෙඩියට ගෙන පිටපත්තෙන් වරුවක් කොටනු. වැදමහ නො වැටුණා නම් අනික් අත හරවා කොටනු.[23] දුම්මැල්ල වැලක් ලොකුකර වලල්ල ගසා ඉසින් පහළට එලනු වදත්.[24] රත්කරල්සැබෝ ඇට කාඩි දියෙන් අඹරා යටිපතුලේ ගානු බිහිවෙයි. මීට ම සාබෙටි මී තෙලින් අඹරා පෙකණියේ ගානු බිහිවෙයි. මීට ම වෙරළු දළු, දමුනු දළු, වන්ඇපල මුල් මේවා අඹරා ඉස ගැණ හිටින විට යෝනි මුව ගානු, පෙකණියේ ගානු බිහිවෙයි.[25] ඉඳිමුල් අඹරා යෝනියේ ගානු.... වන්ඇපල මුල් අඹරා යටිපතුලේ ගානු. විගස ප්‍රසූත වෙයි. නයි සැව ගෙන අපථ්‍ය

19 **තල්පතේ පිලියම්. කාණ්ඩය** 12. (1993) ආයුර්වේද දෙපාර්තමේන්තුව, (1997) කොළඹ. පද්‍ය අංකය 494,

20 එම, පිට. 55

21 එම, පිට 56 මන්ත්‍ර සඳහා එම බලන්න.

22 එම, මෙහි මන්ත්‍ර කිපයක් ඇත. බලන්න එම,

23 එම, (1993) ආයුර්වේද. පිට. 93

24 එම, 7. පි. 47

25 **තල්පතේ පිළියම කාණ්ඩය** 11. පි. 304

මාර්ගයට දුම් දෙනු.[26] නියඟලා අල දෙහි ඇඹුලෙන් උරච්චි කර දකුණු යටිපල්ලේ විලුඹේ සිට පතුල උඩට ගානු. ප්‍රසව වූ විට සෝදා හරිනු.[27] සුසුම් නොහෙළා හෙළ නෙටු මුලක් උදුරාගෙන ඇඟ නොගවා එයින් පිසදමනු වහා ප්‍රසූතවෙයි නැතිනම් දැරිය මිය යයි.[28]

**මළ දරුවෝ වැටෙන්ඩ**

කුකුරුමුවන් ගෙඩියක් දෙහි ඇඹුලෙන් ගලගා දෙපල්ලේ ගානු, බිහිවුනාම සෝදනු. මීට ම මන්ත්‍රයක්, **නමෝ අංගුලිමාල මහත්ථෙරෝ මහාතේජෝ තේජෝ ගුණ විසෙශොෂවිමිනි ගම්බින් කරට මකු හුං හුං එට්ටු ඒට්ටු ඒස්වාහඃ** වැටෙත්, මීට ම, පෙනලවැල මුවෙන් නොබැන කරේ බඳිනු. විගස වදයි. මීට ම ගහේ තිබුණු බේදුරු අලයක් උදුරා යටිපතුලේ ගානු බිහිවෙයි. මේ බෙත් අත්දුටුවයි.[29] තොටිල ගහේ බටහිර පැත්තෙන් ඉහළ සිට පහළට පොත්තක් ගලවා ඉස තබාගෙන ගෙනවිත් දොරකඩ සිටගෙන "වැදුදැයි" විචාල විට ප්‍රසූත කරයි. ලබු බිජු, කුළුරැණ, නයි සැව අබ තෙලින් අඹරා යෝනියට දුම් පානු. සැබෝ මුලක් ගෙන හිස් දොරකඩ තබා කල්සිටුවා නැවත ගෙන හිස සිට දෙපතුලට පිස දමනු.[30] පෙනල වැලේ මුලයි පිටවක්කා මුලයි මුදුහිරුව තනා පයේ මා පොට ඇඟිල්ලේ දමනු. රුදාව තදව බිහිවෙයි. මීට ම, වසුරිකා ලෙඩ බෝවෙච්චි හිස ගෙන ගලගා පොල්කිරෙන් යටිපල්ලේ ඉස් මුදුනේ පෙකණියේ ගානු, මීට ම ඉත්තෑගල වඳුරුගල පොල්කිරෙන්වත් දෙහි ඇඹුලෙන්වත් ඇල්දියෙන්වත් ඉස්මුදුනේ තබනු බිහිවෙයි.[31] නියඟලා අලයක් මී පැණියෙන් අඹරා ඉස්මුදුනේ ගානු එවෙලේ ම වැටෙයි. ඒ විගස සෝදනු.[32]

26 සිංහල වෛද්‍ය විද්‍යාව හා ශතස්ලෝකය, සරත් පි. අඹතලාව. (1996). ගොඩකවෙල. පි. 5
27 එම පි.7
28 එම. පි. 6
29 තල්පතේ පිළියම් කාණ්ඩය 7. පිට. 304
30 සිංහල වෛද්‍ය විද්‍යාව හා ශතක ලෝකය. (1996). පි. 7
31 තල්පතේ පිළියම් කාණ්ඩය 11. පි. 305
32 එම. පි. 93



**දරු බිහිවෙන්ඩ මන්තර**

**ඕං නමෝ අහස හ අඟුලේ මල් සඟුලේ නැන්දා කිරිමැණියන් බමුනුගිණි ගොතටුවේ එගං බෝලේ එගං පුපුර අහසේ අහසේ පුපුරා කහන්ලේ නෙළුන් බුදුන් මතුර දුන්නේ දාන පුදලත්කොට සිටුවා මලේ විලේ පෙති ගැලවී සහං නීලේ යහං නීලෙ එකසිය අට වරක් මතුර මතුරා පිටේ ගානු මළවුන් වැටෙත්.**[33] **ඕං නමෝ එරක්ගත මිහිරක්ගත ධාරාපහුරන්ගෙන මානෙල් මල් විලේ පෙති ගුල උනු ලෙසට අනුරපුර නුවරින් තෙල් බුදු මඟුලේ සම්‍යක් මඟුලේ මිහිසයෙන්රු මතුලෝය බුදු උකුලට දෙපා දුන්නේය. අතුරුවමින් දොරැගුලුවමින් දොරකඩ යවුල්බිඳ පුවක්කීරි බිඳ එළියට එන් පුත එළියට එන් පුත බිහිවෙයි.**[34] මීට ම, **අංහියඃ අං හං හිං** කියා මතුරනු. බිහිවෙයි.[35]

**වැදෑමහ වැටෙන්ඩ**

නියඟලා, තිත්තලබු ඇට, නයිහැව, කෝට්ටන්, අබ මේ හැම එක පමණට හෝ චූර්ණකර අපත්ති මාර්ගයට දුම් දෙනු. මීට ම නයි හැව තල තෙලින් අඹරා දුම් දෙනු.[36] ඔළිඳකොළ ඉස්ම යෝනියේ ගා විල්ලබු අයගේ අතේ ගා විලිපහරනු වැදමහ වැටෙයි.[37] තිත්තලබු ඇට, නයි හැව මේ. හැම දිය නොවන්නට නොකොටා අඹරා දමා ගානු, වැදමහ වැටෙයි.[38] ගර්භිණී චිකිත්සාව ආයුර්වේද මූල ග්‍රන්ථයන් වන චරකසංහිතා, සුශ්‍රැතසංහිතා ආදියෙත්, ලාංකේය කෘතිවන සාරාර්ථ සංග්‍රහය, යෝගරත්නාකරය වැනි කෘතිවලත් තිබෙයි. ඒවායේ තිබුණු ඇතැම් කෙම් ක්‍රම ගැමි වෙදකමට පැමිණ ඇති බව ඇතැම් ඒවායින් පැහැදිලි වෙයි. එමෙන්ම කිසිදු මහා සම්ප්‍රදායකින් ආභාසය නොලැබ ප්‍රගුණ කළ සහ භාවිත කෙම් ක්‍රම රටාවක් ඉහත චිකිත්සාවට සම්බන්ධ බවට සාධක පළ වෙයි. මේවා ප්‍රාදේශිය ලෙස සහ ගුරුකුල ලෙස විවිධ වෙයි. දැනට ලිඛිත සහ ලේඛනගත නොවූ යන දෙයාකාරයෙන් ම මේවා

33 තල්පතේ පිළියම්. කාණ්ඩය 12. පි. 53
34 එම, කාණ්ඩය 11. පි. 97
35 එම. 94
36 මහසම්මත ගර්භවිධිය, පත්ඉරුව 'ඛ'
37 එම. පත්ඉරුව 'කි'
38 තල්පතේ පිළියම්. කාණ්ඩය 11. පි. 97

තිබෙන්නට පුළුවනි. මේවායෙන් යම් ප්‍රමාණයක් අනුලේඛනයට ලක්ව ඇත. අනුලේඛනයට නොගත් දේ අනුලේඛනය කිරීමත් ජනශ්‍රැතියේ ඇති මේ ආශ්‍රිත කෙම් ක්‍රම ලේඛනයට හසුකිරීමත් කාලීන අවශ්‍යතාවකි.

**සර්ප විෂ හරණය**

අෂ්ටාංග ආයුර්වේදයට අනුව විෂ චිකිත්සාව අගදතන්ත්‍ර වශයෙන් හැඳින්වෙයි.[39] අගදතන්ත්‍රයට අනුව සර්පවිෂ හරණය සඳහා ඖෂධ ප්‍රතිකාර ක්‍රම මෙන් ම මන්ත්‍ර ආදී කෙම් ක්‍රම භාවිතය ද දක්නට ලැබෙයි. ආයුර්වේද මූලග්‍රන්ථයක් වන සුශ්‍රැතසංහිතාවෙහි මන්ත්‍ර පමණක් නොව මන්ත්‍ර භාවිත කරන අයට ද උපදෙස් සපයා තිබෙයි. ඒ බව සුශ්‍රැතසංහිතා පස්වෙනි අධ්‍යායයේ 8-14 යටතේ දක්වා ඇත්තේ මෙම නියමයන් ය. ඒවා මෙසේ ය. මන්ත්‍රඥ වෛද්‍යවරයා මතුරන අතර ම අරිෂ්ඨාබන්ධනය යෙදිය යුතු ය. මැතුරූ රැහැන් ආදියෙන් සිදුකෙරෙන මේ බන්ධනය විෂයට ප්‍රතිකාරයකි. දේව බ්‍රහ්ම යන ඍෂින් විසින් කියූ සත්‍ය වූත්, තපොමය වූත් මන්ත්‍ර සමූහය දුක සේ ඉක්ම විය යුතු වන අතර විෂ පදාර්ථය ශීඝ්‍රව නසා දමයි. එය ඒකාන්තය සත්‍ය වූත්, බ්‍රහ්ම තපෝමය වූත් මන්ත්‍රවලින් ශීඝ්‍රව විෂය නිවාරණ කට හැකිවාක් මෙන් ඖෂධ වර්ග යෙදීමෙන් එය නොකට හැකි ය. ස්ත්‍රී - මාංස - මද්‍ය යන මේවා සේවනය කිරීම් වර්ජනය කොට, තමන් ම ආහාරපානාදිය පිළියෙල කොටගෙන භෝජනය කරමින් සිරුර පිළිබඳ ඇතුළත පිටත යන දෙකින් ම පවිත්‍ර ව කුසතණවලින් සකස් කළ අසුනෙක හිඳගෙන මන්ත්‍ර ග්‍රහණය කළ යුතු ය. සුවඳවත් මල් මාලා - බලි - ජප - හෝම යන මේවායින් මන්ත්‍ර සිද්ධිය උදෙසා යන්ත්‍ර පූර්වකව දෙවියන් පිදිය යුතු ය. ස්ත්‍රී - මාංශ - මද්‍ය යන මේවා වර්ජනය කිරීම ආදී විධිවලින් තොර නුවූ මැතුරුම් සියල්ල මෙන් ම ස්වර හීන වූ මැතුරුම් ද සිද්ධිය නො සලකයි. එබඳු මැතුරුම් නොකට හැකි අවස්ථාවලදී අගද (ඖෂධ) වර්ග යෙදිය යුතු ය.[40] ආයුර්වේද

39 ගල්මංගොඩ, සුමනපාල. ආයුර්වේද අධ්‍යයන (2003), ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද අයතනය, කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල, පි. 8

40 සුශ්‍රැත සංහිතා (සිංහලානුවාදය), සම්පාදක ආර් බුද්ධදාස (2007), ආයුර්වේද දෙපාර්තමේන්තුව, කොළඹ, පි. 656.



මතය අනුව ඍෂිභාෂිත මන්ත්‍ර පසුකාලීන විෂ වෙදවරු භාවිත කළ බවත් පරපුරින් පරපුරට පැවත ආ බවත් විවිධ මූලාශ්‍ර අනුව පැහැදිලි ය. විවිධ භාෂාවන්ගෙන් මෙන් ම විවිධ ප්‍රමාණවලින් යුත් මන්ත්‍ර රැසක් විෂ චිකිත්සාව යටතේ පවතින බව පැහැදිලි ය. මේවා ද යම් ප්‍රමාණයක් පුස්කොළ පිටපත්වල තිබෙයි. තවත් ප්‍රමාණයක් පුස්කොළ පිටපත්වලින් අනුලේඛනය කොට මුද්‍රණයට ලක් කර තිබෙයි. තව ප්‍රමාණයක් මුඛ පරම්පරාගතව තිබෙයි. මුඛ පරම්පරාගතව පැවති දැනුම දූරාතීතයේ සිට ලේඛනයට ලක් කළ ද සියලුම දේ ලියා ඇතැයි සිතිය නොහැකි ය. සර්ප විෂ හරණය සඳහා භාවිත කෙම් ක්‍රම යටතට ගැනෙන මෙකී මන්ත්‍ර කීපයක් මූලාශ්‍ර ගණනාවක් ඇසුරින් මෙහි දැක්වනු ලැබෙයි.

**ඕං නමෝ වම්පය ගුරුලාය දකුණු පය ගරුඬාය. වරාසාලේ බත් පිස ඇල්මොණර මාලුවෙන් අනුභව කොට මම යන්නේ ඇලිඋෟරු දණ්ඩේ මේ ඇලි මුකටි කකුලෙනි මෙයින් පයට කෙළගසනු.[41] සිදධ සිරියාලු වේලේ රිරි උරාගන් අප්පොච්චි කට්ටු කට්ටු ජ්ස්වාහඃ** මේ මන්ත්‍ර තුන්දොස් බන්ධනයයි. සෙනසුරාදා පිටත් නැකතින් ගසමුල මල්බුලත් තටුව තනා සුදු නූල් නව පොටයි, ගැට නවයයි, ලෙඩාගේ නමයි හිර කර ගැට නවය අසුරුවා ඉරිදා උදේ පැඟිරි ගහේ මුල බඳිනු. ලෙඩාගේ නමයි වෙදාගෙ නමයි කොළ දෙකේ ලියා රූප දෙක අසු කර තුන් පලකින් කටු ගසනු.[42] **ඕං හ්රීං ඕරාය ඕං හරිං රාලිය ඕන් හිරින් කාල රාක්ෂි අම්මා නම් කූට පර්වතේ වැසෙන අකුණු යක්ෂණී දෙවුර ගිණිලයි පපුව ගිණිලයි දෙකලවා ගිණිලයි අදත් මේ නරයාගේ ඉසට ගිනිකඳක් මවයි ඔඩඩිය දිෂ්ටි ජ්සවාහඃ** මෙයින් මතුරා යකිනාරං කටු තුනක් ගෙන රුක්අත්තන කිරි මුසුව එක් කර දෙහි ගෙඩියේ ඒ කටු තුන ගසා නම අසු කර ලියා මඩේ පාගනු. අතපය කුනුවෙයි.[43] මේ මන්ත්‍රය විෂ බැස්සවීමට නොව විරුද්ධවාදියෙකුගේ විෂ බැන්දවීමටයි. මේ දුෂ්ඨ චේතනාවකි. එබඳු දේ ද ඇත. **ඕං නමෝ සුරවැල විෂ්ණු මුණ්ඩල් මකරී විය**

41 සර්ප වෙදකම, ප.එ.ප. දැරණියගල (1956), ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, කොළඹ, පිට. 6

42 එම. පි. 41

43 එම. පි. 46

මුණ්ඩාල් තකරී විස මුණ්ඩාල් ලෝතාල විස මුණ්ඩාල් ඕන් සුරුවාල ගරුඩාය සියලු විසයඃ සර්පයා කෑවාය කියා ආවාම ඔහුගේ නම අල්ලා වතුර මතුරා කබල රත්කර වතුර එලනු විස දා යෙයි.[44] ඕං ජය ජය තර්කේස්වහඃ මේ මන්ත්‍රය කියා පෙකනිය පිස දමනු. ඕන් ජය ජය පත්මේස්වහඃ මේ මන්ත්‍රය කියා ලපැත්ත පිස දමනු. ඕන් ජය ජය සංඛපාලේස්වාහඃ මේ මන්ත්‍රය කියා පොළවට පිස දමනු විෂ බසී.[45] ඕන් ජය ජය වාසුකි යේශ්වාහඃ මේ මන්ත්‍රය අතට සත්විටක් මතුරා දන ඉස පතුල බලා අරගෙන ගොස් ආකර්ෂය කොට බිමට ගසනු විෂ දා යෙයි.[46] ඕං ජය ජය නං නේස්වාහඃ සත්විටක් අතට මතුර ඇඟට ගසනු, නයා පොළඟාගෙන් උපද්‍රා වූ විට උඩදෙන පිදේනි නම්, උන්ගේ දළ සතරේ දේවතාවියෝ සතර දෙනෙක් ඇත. ඒ සතර දෙනාගේ නම් විසපොති, දලපොති, ගිණිපොති, නිදිපොති, උන්ට දෙන පිදේනි නම් සුද්ධ පවිත්‍ර ව කර නොකර හාල් රොටී තුනයි, කැවිලි ගෙඩි තුනයි, හාල් මිටි තුනක බත් උයා හත්මාලු පුළුටක් ඇතිව ගෙයි හතර කොණ පෙට්ටි පිටි ඟතරක් තබා මේ සැමදේ පුදා පිදේනියක් දෙනු. දෂ්ට කළ තැන මැස්ස ගසා ගුරුල්ල ලී හතරක් සිටුවා ඇවරි කණු තනා ඒ පිට බත්ගොටු තබා ඒ මැද්දේ කසපැන් ගෙඩියක් ඇස්ස ගසා තබා දුම්මල ගසා වතුර වඩනු, පිරිත් ආරක්ෂා කරනු ඉන්පසු වෙදකන් කරනු.[47] මෙහි ආරම්භය කුඩා මන්ත්‍රයකි. එයට අමතර ව පිදෙනියක් කෙම වශයෙන් තැබේ. පිරිත් ආරක්ෂා කරවා පසුව වෙදකම් කිරීමටත් උපදෙස් සපයා තිබේ.

නමෝ මහමුහුඳ මැද දී සත්මුදෙන් ඇත සත්මූද මැද්දේ කිරිමුහුද මැද්දේ ගල් පර්වතයේ ගරුඩ රාජයෙක් ඇත. ඒ ගරුඩ රාජයාගේ ඉසේ අතේ පයේ දෂ්ඨ කළේලු විෂ මුගේ නොවෙයි කෑවේ මුවය සර්ප විස නැසියඃ[48] ඕන් නමෝ අප සමග සම්බුදු මැණියන් වහන්සේ මහ මුහුද මැද විෂ ලියද්දක් තැනුසේක විරලිය ගහේ ඉන්නා රන්වන් කපුටුවා ගසා කෑ හෙයින් මේ විස

44 සර්ප වෙදකම, පි. 57

45 එම, පි. 14

46 එම

47 එම, පි. 40

48 තල්පතේ පිළියම් කාණ්ඩය 9. පි. 3



මුව එක්වෙනුවත් දෙවෙනුවත් තුන්වෙනුවත් සර්ප විෂ නැතියඃ[49] ඕන් නමෝ පැල්ගිලිනම් ගලයට ඇලිමුකටියෙන් ඇත, පස්පැයට පස්කරේය පැයට අලු කෙරෙන හෙයින් ගිනි කෙරේ පොළගුන් දැක අලු කෙරේ ස්ථාන දහයක් බුදුරදුන්ගේ රුවන් කෙත් ආබලිය දවා කටින කළේ යශට කුමක් උසට අහසේ තරු බැලීය දමාහකලිණ කෙළේය කෑමුබ බැලීය කෑ කෑ දිෂ්ටියෙන්ම බැලීය අසණ්ඩාලයා තෝ නොදැන කෑ නම් මම දැන විෂ බෑම් හෙයින් තට විෂ නැතියඃ[50] ඕං ශ්‍රී අන් හන් ක්‍රෝන් ගරුඩ ඒහි ඒහි ගරුඩ ගඩප්පු නරෙව ජීවමරඃ නානා ගරුඩස්ස නන්දිවෙන්දිය‍ා වක්‍ර මූ නජ්ජවර හෝ චන්ද්‍ර ඒස්වාහඃ බෙහෙත් දෙනකොට අගේරුයින් මතුරනු[51]

ඕං නමෝ අප සම්මා සම්බුදු මැණියන් වහන්සේ මූදෙන් ඒ දේශේ වඩිනා ගමනේ දී බැමිණියක දැක කන් කියන්නා නයිදරණ කෙලියේ පොළොගුන් ස්වාසුදහසක් සර්පයිඬ මැදට කෙලියේ ඉසටි කඩා ඉස දැම්මි. දළකඩා දළ දැම්මි, මා දන්නා වෙයි, බුදුන් ගුරු ඇදුරුව සිටියේ ස්වඃ යයිනට සර්ප විෂ නැතියඃ[52]

ඕං සකතාකාරි බගතාකාරි බගතේ මැනෝ තෝජේතුකො බහාගිතො ප්‍රේතා මාපෝ වාලා මා ජෝ වාලගතේ ඕදේවාඃ ගුරුගේ මහිකාලේ රාජා මහිකාලේ බෝමහීතා ජාකීලේ පෝඩහඃ අං අඃ ඉහ දියාබෙ ඟුරු ගුරුහඃ සත්‍ය මන්ත්‍රයකි මේ මන්ත්‍රයෙන් ඕනෑම සර්පයෙකු දෂ්ටකරපු වේලාවක දී දෙහි අත්තෙන් මතුරන්න. අතුගාමින් මතුරන්න කොහොඹ කොළ කටේ තබාගෙන විෂ උරන්න[53] ඕන් නමෝ මූගලස්ස ශරශ වොගේන ගර්ධස්ස පස්සවොගේන හරිහර වසනේරි විෂ පට්ට යේස්වාහඃ මේ මන්ත්‍රයෙන් සත්විටක් මතුරා වතුර ඉසිනු[54] ඕං හ්‍රෙං හ්‍රෙං රුඩාහේළු සුං සුං හුං හුං ආවේස ආවේස යක්ෂයේස්වාහඃ විසමුරුත්තාවට දියට මතුරා ඉසිනු. උපදින් සත්තයි ඃඕං ප්‍රොන්

49 තල්පතේ පිළියම් කාණ්ඩය 9. පි. 3

50 එම.

51 එම.

52 එම.

53 උපනන්ද හිමි, පැලවත්තේ. ගොඩාමුනේ පාරම්පරික හස්ථසාර වෙදපොත පි. 58

54 එම. පි. 16

ප්‍රෝං ස්‍රෝං පට්ටම් යේස්වඃ විස මුරුත්තාවට මතුර මතුර ඉසිනු මළ උන් උපදිත්.[55] ඃඕං විෂනායක විෂනායක ගරුඩා හලාහල විෂ පක්‍ෂිය මහාරාජාය ගරුඩා හල හල සර්ප විෂ හකුණියාපො ඕං ගරුඩා හලා හල විෂ දිර්ස විෂ උරණ විෂ පූර්ණ විෂ නීල විෂ දල නීල කණ්ඩ විෂ දන්ථ විෂ හත්නිවිෂ මූලෙන් ඡේදනී ඉල්ල පොඃ සියලු විෂ යට යහපොති [56] ඕං ගරුඩනාග දේව මිනේස්වඃ ඕං බෙිපිත් වාපිත් මූනේශ්වඃ හය කච සගුරුළුරපු ස්වඃ මේ මන්ත්‍ර තුන දොළොස්දහස් මන්ත්‍රවලට නායකයිඃ හැම සර්ප විෂට දෙහි අත්තෙන් මතුර විෂබානු සනාතයි [57]ඃ ඕං සෙරෙප් නෙරේස් බාමා හුම් හිම් නටු නටුයේ සේයිං මාස්යිං බාම් බාම් පාම්බු උඩු අඩා උඩු පැං පෙරා මෙම මන්ත්‍රයෙන් දෙනු සියලු විෂ බසී සත්තයි [58] බී. සිරිසේන මහතා දක්වන පරිදි එම පරම්පරාගත වෙද පොත් විවිධ ප්‍රමාණවල මන්ත්‍ර විෂ හරණය සඳහා ඇත. ඒ අතර මුද්‍රිත පිටු දෙකක ප්‍රමාණයෙන් යුත් මන්ත්‍රයක් අන්තර්ගතවෙයි [59]

ඕං නමෝ සිරිකුං දැහැන සිරිකුං. වෛද්‍යයන් වෙත ජනයා පැමිණ සර්පයෙක් කෑවායි කියන කොටම ඉහත දැහැනෙන් සත්විටක් මතුරා දැන් හොඳයි කියා ඇඟිලි දිග හරිනුඃ විෂ බසී.[60] සිල්ල බිල්ල කාපු බිල්ල විල්ලකානු බුලුඃ 21 වරක් මතුරා ඉහළ සිට පහළට පිස දමනු විෂ බසී [61]ඃ ඕං ප්‍රෝං ද්‍රෝං ක්ෂෞං පටියේස්වහා නමෝ ගෝතමේ භගවා සිද්ධි හුං හුං ප්‍රිය ස්‍රියඃ ඕං ඕං හ්‍රිං හ්‍රිං ක්‍රිං ක්‍රිං බ්‍රිං බ්‍රිං ප්‍රිං ප්‍රිං එස්වාහඃ සියලු විෂ බසී ඃ දෙහි අත්තෙන් 108 වරක් මතුරනු. [62] තිලකිතේ ථූපාරාමේ හර හර දේසේ නන මුහු නාදේ කණ්ඩ කණ්ඩ මුප්පත්තු අමලං තමලං තිත් පොළොන් මල්කරවල් දුනුකරවල් තිග ඇඟ විෂ පෙල්ලක් ඇතැයි

55 පරම්පරාගත වට්ටෝරු වෙදපොත. සංස්කාරක ආචාර්ය බී. සිරිසේන, (2006). ඇස්. ගොඩගේ. මරදාන. පි. 27

56 එම පි. 39

57 එම. පි. 27

58 එම. පි. 24

59 එම. පි. 47-49

60 විෂවෙද මුතුහර සම්පාදක සිසිර කුමාර ලියන ආරච්චි (1972) ජයන්ත් ප්‍රින්ටර්ස්, ගාල්ල.

61 එම. පි. 37

62 එම. පි. 85



කියන්නා හු ගඩ ගඩ ඒස්වාහුඃ.... 108 වරක් මතුරනු විෂ බසී [63] ඕං අරික්කාල් මුප්පත්තු ඉතිපිසෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ මුදං පරිනෙට්ටු සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසධම්මසාරථී සත්ථා දේව මනුස්සානං සුරක්කට්ටු විෂ්ණු අනින් බුද්ධෝ භගවාති 120 වරක් මතුරනු විෂ බසී [64] ඕං ලේ ලී සී සී වෙ යන ලඩි ස්‍රි කා රා ගේ නාගිත සිලි සිලි ඒස්වාහඃ 108 වරක් මතුරනු විෂ බසී [65].... ඕං නමෝ අප සම්මා සම්බුදු මැණියන් වහන්සේ බුදු වී වඩිනා ගමනේ දී උන්වහන්සේ බුද්ධ කීර්තිය බලන්ඩ ඕනැයයි කියා මහ කෙල නාගරාජයා උන්වහන්සේගේ ඉදිරියට ඇවිත් වම් ශ්‍රී පතුල දෂ්ට කළෝය එවිට උන්වහන්සේ කිසිදු බියක් නොමැතිව දකුණු ශ්‍රී පතුලෙන් පිසදැමූ ආනුභාවෙන් ආඥාවෙන් අදත් මොහුට දෂ්ට කරන ලද සර්ප විෂ කැමුබයෙන් මහ පොළවට හංග හංග ඒස්වාහඃ සියලු විෂයට දෙහි අත්තෙන් මතුරනු.[66] ඕං නිල කුණ්ඩ දළ කුණ්ඩ රුවන් සූත්‍රානු භාවෙන් සූං සූං පක්ෂි පක්ෂි පෝඩු පෝඩු නමඃ ඕන් ජය ජය සංඛපාල ඒස්වාහඃ

කුප්පමේනියා ගසින් මතුරනු. තමාට නත් අතට මතුරා පිස දමනු විෂ බසී.[67] සිසිර කුමාර මානික්ක ආරච්චි මහතා සිය විෂ වෙද මුතුහර සම්පාදනය කිරීමේ දී දිවයිනේ බොහෝ සර්ප වෙදවරුන්ගෙන් තොරතුරු ලබාගෙන තිබෙයි. ඒ අතර ආයුර්වේද සහ පාරම්පරික දේශිය වෛද්‍යවරු සිටිති. ගිහිපැවිදි දෙපක්ෂයට අයත් එම පිරිස 191 කි. විවිධ දේව ගුණ, බුදු සහ තවත් ගුණ කියැවෙන මන්ත්‍ර රැසක් ඒ අයගෙන් ලබාගෙන පළ කොට තිබෙයි. මින් එක මන්ත්‍රයක් පමණක් ක්‍රිස්තු දෙවියන් වෙනුවෙන් තිබෙයි. නාත්තන්ඩිය තුම්මෝදර යූ.ඇස්.ඇෆ්. ප්‍රනාන්දු මහතා සපයා ඇති එම මන්ත්‍රය මෙසේ ය. ඕං සර්ව බලධාරි සර්වඥ සදාකාලික ජීවමාන ක්‍රිස්තුදෙවාය නමඃ.... සියලු විෂ දෙහි මුරුංගා අතුවලින් මතුරනු යනුයි.[68]

63 විෂවෙද මුතුහර සම්පාදක සිසිර කුමාර ලියන ආරච්චි, (1972), ජයන්ත් ප්‍රින්ටර්ස්, ගාල්ල. පි. 97

64 එම, පි. 101

65 එම, පි. 103

66 එම, පි. 272

67 එම, පි. 301

68 විෂවෙද මුතුහර සම්පාදක සිසිර කුමාර ලියන ආරච්චි (1972) ජයන්ත් ප්‍රින්ටර්ස්, ගාල්ල. පි. 327

**බැඳිවිෂ කැපීම**

**ඕං නමෝ ඉරමඬලෙන් ඉරමඬල කැපිමි සඳමඬලෙන් සඳමඬල කැපිමි සවනක් ගණ බුදුරැසින් තිත් අඳුර කැපිමි මන්ත්‍රානුභාවයෙන් මොහු ඇගේ විෂ කැපිමි. මහපොළවට සර්පවිෂ හංග හංග යේස්වාහඃ**

**ඕන් සර්ප විෂ කාලිම් අද්‍යමහා කාලිනියේස්වාහඃ ඕන් නමෝ මහාරි ග්‍රිං ග්‍රිං ඝෞරහද්‍රයක්ෂ අපිල නමෝ තුණ්ඩි ඕන් නීල කණ්ඩ විෂ කණ්ඩ කණ්ඩේස්වාහඃ ඕන් හලා හල විෂ හංග ඒස්වාහඃ ඕන් අෂ්ටාංග ෂෝටෂාංග විශ්ලේශානි සිදධගුරු පොඃ ඕන් නමෝ ගුරුලනින් නාසයෙන් විෂ ඔහුට මැගටින් පිටින් විෂ ඔහු මොණතින් බඩින් විෂ බටුහ ගරුඬනින් දෙපතුලෙන් විෂ බටාහ සර්ප විෂ බසීවා නමො සුල මාලේස්වාහඃ**[69]

සර්පයකු දෂ්ට කළ කල්හි එම රෝගියාගේ විරුද්ධවාදියෙකු විසින් වෙනත් මන්ත්‍රාචාර්ය වෛද්‍යවරයකුගේ ආධාරයෙන් විෂ බැඳීම සිදුකරනු ලබන්නේ යැයි පිළිගැනීමක් තිබිණ. සතියේ දින හතට අදාළව විෂ බැඳීම සිදුකර ඇත්නම් ඒ ඒ දිනයන් සඳහා විෂ බෑමට වෙන් වූ මන්ත්‍රය සහිත සිංහල පද්‍ය ප්‍රමාණයක් තිබෙයි. ඒ මෙසේ ය.

ඉරිදා හිමි අනන්ත යා
සිටි සමයේ සරණත යා
නොදැන කළොත් සිවුසැට යා
කපා බසින් බැඳි විස යා

**ඕං හ්‍රිං හ්‍රිං සර්ව විෂ සුං සුං ඡේදන ඡේදනඒස්වාහඃ**

සඳ මැද ඇඳි ගණන් දා
යදියට මුනි දන් දුන් දා
සඳු දින බැඳි විසකන් දා
සිඳ බිඳ කැපුවෙමි සත් දා

69 සිරිසේන, 2006. පි. 43



**ඕං හ්‍රිං හ්‍රිං සර්ව විෂ සුං සුං මහාපද්ම ඡේදන ඡේදන ඒස්වාහඃ**

බුදුවි මුනි කුප දිගු යේ
වැඩ හුනි වජ්‍රාසන යේ
එමුනි හසින් බැඳිවිස යේ
සිඳ බිඳ කප සියෙලඟ යේ

**ඕං හ්‍රිං හ්‍රිං සර්ව විෂ බන්දන සුං සුං ඡේදන ඡේදන ඒස්වාහඃ**

එදා මුනිඳු ඉඳ බෝ මුල
බෙඳා දහම් හැරි ලෝ තුළ
යොදා එ සිරි දහමේ බල
බදාද විෂ කපාල හල

**ඕං හ්‍රිං හ්‍රිං සර්ව විෂ සුං සුං තර්කුට ඡේදන ඡේදන ඒස්වාහඃ**

ගුරු තිලොවට අප මුණිඳු න
පුත් මහසඟ රහත් බලෙ න
බැඳ විෂ ගත නුගුන දුද න
දුරුකර කප ගුරුදා වි න

**ඕං හ්‍රිං හ්‍රිං සර්ව විෂ සුං සුං කපා ඡේදන ඡේදන ඒස්වාහඃ**

සිකුරු දිනේ සිවු දලයෙ න
පතුරුවොපු මුනි දහම් න
කපුරුනාද ගුරුන් බෙලෙ න
නපුරු වෙමින් කපත් යෙහෙ න

**ඕං හ්‍රිං හ්‍රිං සර්ව විෂ සුං සුං සර්ව අංග ප්‍රත්‍යඟ ඡේදන ඡේදන ඒස්වාහඃ**

නිලගය සෙනසුරු ඇඳ නා
පලගය අද මිදුනු දි නා
ගුලිකය කෑ විෂ ඇදි නා
සියොලඟ විෂ මුල් සිඳි නා

**ඕං හ්‍රිං හ්‍රිං සර්ව විස සුං සුං ගුලික ඡේදන ඡේදන ඒස්වාහඃ**

සත්සිය විෂඝෝර සතු    න්
පද්ම සංඛපාල නම්    න්
මෙත් මුනිඳුන් විවරණයෙ    න්
සත් දින බැඳි විෂ කැපුයෙ    න්

**ඕං හ්‍රිං හ්‍රිං සර්ව විෂ සුං සුං සංඛපාල ඡේදන ඡේදන ඒස්වාහඃ**

ඒ දේසේ මැවු    දෙ    ස්ස
මේ දේසෙට ගෙනා    දෙ    ස්ස
ඉර දෙස් තර මතුර    දෙ    ස්ස
කපා බසින් නමො    ත    ස්ස

ගවුතම අපෙ මුනිදා    ස    දා
විසල්පුරට වැඩිය    එ    දා
ඇරියාමෙත් දෝස    මු    දා
පලයන් විත නොයිට    අ    දා[70]

**වතුර මැතිරීම**

**ඕං ත්‍රැන් ත්‍රැන් සං ස්වාහඃ මෙයින් හත්වරක් පැන් මතුර** පිස දමනු විෂ බසී.[71]

රත් කබලට පැන් මැතිරීම

**ඕං ඉරච්චි තම්රානේ පලයන් තෝස්වාඃ ඕං නමෝ තකරිය මකරිය යමිය යම දූතිය කාලරාක්ෂිය හුන් හුන්.** හත් විටක් වතුර මතුරා රත් කබලට දමනු විෂ බසී.[72]

**දූතයාට ජලය පෙවීම**

ඉරච්චි තම්බිරානේ පලයන් තෝස්වාහඃ හා ඕං තකරි මකරි යමදූති කාලරාක්ෂි හුං හුං පලයන් තෝස්වාහඃ ඕං සිං පො පක්ෂි

70 සිරිසේන, 2006. පි. 43
71 උපනන්ද හිමි. පි. 117
72 සිරිසේන 2006. පි. 26



පක්ෂි පො- මේ මන්ත්‍රය හත්විටක් මතුරා දූතයාට වතුර පොවනු. විෂ බසී.[73]

**අතට මැතිරීම**

ඕං හ්‍රිං හ්‍රිං ප්‍රිං ප්‍රිං මයං - අතට මතුරා පිස දමනු.[74]

**ටොක්ක අනින මන්ත්‍රය**

ඕං ක්‍රොං ක්‍රොං ප්‍රොං ප්‍රොං ශ්‍රොං ශ්‍රිං ශ්‍රී බං යඃ හ්‍රිං යඃ මොහුට පටා.... **මෙය සිහිකරමින් යනු. සර්පයෝ නොකත්.**[75]

මේ මන්ත්‍රයෙන් හත්විටක් අතට මතුරා ආ දූතයාට ටොක්කක් අනිනු.[76]

ඕං පක්ෂි රූස්වට්ටි පොඃ...... මෙයින් අතට මතුරා ටොක්කක් අනිනු මූර්ජාව පවා මගහැරේ.[77]

**ගිණිපෙනෙල්ලට මැතිරීම**

**ඕන් කුරුවාල කුරුවේන් පංචාල ඒං තම්බිමරක්කාලුං** ගුරු **කන්දමාරුවියේ ගුරුක්කට්ටුයේ නෙරෙප්පු තුඩුත්තු ආනඳුමේල්** ගිනිදැල් මැකුවේ මවයි..... ඔපිච්චේන් වාලේ කොණ්ඩාන් ප්‍රොංදු ප්‍රොංදු වෙන්ද අටාරියේ දවල ගිනාකාය ආ රුසියානන් මමය.... **බහු විෂ බාහු සීතලේ ගියෙහි යේවාහඃ.....** මෙයින් ගිනි පෙනෙල්ලට හත්විටක් මතුරා කෙල ගසා ගිනි පෙනෙල්ල දියේ ඔබනු.[78]

**වක්කන් ඇල්ලීම**

තද අරක්කුවලින් තෙමන ලද කඩදාසි කැබැල්ලක් ගිනි දල්වා එකෙනෙහි ම වීදුරුවකට දමා මුඛය වසනු. එවිට දෂ්ට කරන ලද සර්පයන් විෂ වීදුරුවට ඇදී එයි.[79]

73 උපනන්ද හිමි. පි. 117
74 එම. පි. 117
75 එම.
76 එම. පි. 116
77 එම. 119
78 එම. 117
79 සිරිසේන; 2006 : පි 75.

**අතුල්පහරින් විෂබෑම**

ඕන් නමෝ ආනාලයෙන් ගිනි ගිනි ඒ කණ්ඩලීයේ ඇඟිල්ලේ අවරින් ඉවරින් කඩ්ඩු කරිච්චි පෝ අඩෝ පොඃ.... අතට හත් වරක් මතුරා අතුල් පහර ගසනු. විෂ දා යෙයි.[80]

**ගිනිපෙනෙල්ලට මැතිරීම**

ඕං කුරු කුරු වාලවෙන්නං වාලඑන්නාඩි වාරක්කාලු ගුරුතංඩ මාරමින් ගුරුක් කට්ටු තුඩු දී තැනට ගිනිපල් මැව්වේ මවයි.... ඩප්පිච්චේන් කොන්ඩේන් ආචාරි එන්දන් ගිනිමල ගිනිකඩ රුසියානම් මමයි.... බහු විෂ බහු සීහල බහු ඒහි ඒස්වාහඃ..... අළු කෙහෙල් ගොටුවට වතුර පෙරාගෙන නම් සිහිකර 108 වරක් මතුරා ගින් පෙනෙල්ල දියේ ඔබනු. හැම සර්ප විෂ බසී.[81]

එයටම - නමෝ තේජ තීලෝපිය ශ්‍රී සර්ප විෂ බසි පො.... නම ශ්‍රී බුද්ධ ජය ශ්‍රී සර්ප විෂ බසි පො..... නමෝ ශ්‍රී විෂ්නු ජයශ්‍රී සර්ප විෂ බසීවා.... වතුර හත් වරක් පෙරා ගොටුවට දමා මේ දැහැත් තුනෙන් 108 වරක් නම අසා ගිනි පෙනෙල්ලට මතුරා වතුරේ ඔබනු විෂ බසී.[82]

**දූම්මල ඇල්ලීම**

ඕං සකාජානා මාකාලී කීතාජානා ලෝකාපීතා හේලාහේ ආකාස ලංගි මේතා කීලා සර්පහාරේ මාමායා ලෝහා ආදේ සගුරු කි හේහේ ජවනි ජෝ මාමාතාකි සර්පවිෂ නහිරෙ ලෝකස්වාමිනි විස නහිරේජඃ..... හත්විටක් දූම්මල මතුරා දත් දෙනු විෂ බසී.[83]

**නයි එලවීමට**

ආසීකාරේ නාසීකාරේ නයිනාසිකාරේ නයි දරණ උසි උසි .... මෙයින් 21 වරක් වැලි මතුරා ඉසිනු.[84]

80 සිරිසේන, 2006. පි. 27
81 එම. පි. 26
82 එම. පි. 25
83 එම. පි. 26
84 උපනන්ද හිමි. පි. 120



**සර්පයන් එලවීමට**

ඕං ෂුකල්ලී පො... මෙයින් වැලි මතුරා ඉසිනු සර්පයෝ දුවත්.[85]

**සර්පයන් ඇල්ලීමට**

ඕන් නමෝ අසර්ප සර්ප භගවතී නමඃ අතට හත් වරක් මතුරා සර්පයන් අල්ලනු.[86]

**නයා මල්ලට ගැනීමට**

ඕං හර හරේ ආවෝ ආවෝ අඩංගු අඩංගු ජෝ හෝ ජෝ හෝ මා ගිල් ගිල් ආවෝ අඩංගු අඩංගු ස්වාපියානේ අඩංගු.... මෙයින් මල්ලට මතුරා තබනු සර්පයා මල්ලට එයි.[87]

**සර්පයා මැරීමට**

ඕං ගරුඬායා ආලින්දා යසස් කර යස්හී ස්වාහ.... දෂ්ට කළ තුවාලයට 108 මතුරනු සර්පයා මැරෙයි.[88]

**සර්පයන් දෂ්ට නො කිරීමට**

නමෝ අහං බවරාට සාමි වජිර හස්ථි නාථයම් ක්‍රතේෂ්වර මහේෂ්වර මුඛේෂ්වර හරරිශාවාහා.... මේ මන්ත්‍රය පාඩම් ඇති අය සර්පයෝ නොකත්.[89]

**අලි ඇත්තු පළවා හරින මන්ත්‍ර**

ශ්‍රී ලංකා ඉතිහාසය තුළ අලියා සහ ඇතා යනු බහුකාර්ය උපයෝගිතා වෙනුවෙන් හසුරුවා ගත් සත්ත්වයෝ දෙ දෙනෙකි. පුරාතන සාහිත්‍ය මූලාශ්‍ර සහ නූතන වාර්තා අනුව මේ සම්බන්ධ බොහෝ තොරතුරු තිබෙයි. වල් අලියා හෙවත් වර්තමාන වන අලියා මිනිසාගේ කාර්යයන් සඳහා මෙල්ල කර ගැනීමට විවිධ ශිල්ප ක්‍රම පැවති බවට සාධක දක්නට ඇත. අලි ඇතුන් හා

85 උපනන්ද හිමි. 119
86 එම.
87 එම, 120
88 එම, 117
89 එම, 116

සම්බන්ධ වෙද පොත් තුළ ද විවිධ අභිචාර ක්‍රම තිබෙන බව පැහැදිලි ය. පැරණි පුස්කොළ පිටපත් ඒ අතර මුල් තැනක් ගනියි. දැනට අභාවිත මෙම න ස්පර්ශිත උරුමය වාර්තා කිරීම මතු ප්‍රයෝජන සඳහා වැදගත් ය. මීට කලකට පෙර පැරණි පුස්කොළ පිටපත්වල අන්තර්ගත අලි පිළිබඳ වෛද්‍ය තොරතුරු සහ අභිචාර විධි ප්‍රමාණයක් ප.එ.ප. දැරණියගල මහතා විසින් සංග්‍රහ කරන ලදුව ජාතික කෞතුකාගාර දෙපාර්තුමේන්තුව මගින් එය 1952 දී ප්‍රකාශයට පත් කෙරිණ.[90] ඒවාට අමතර ව තව ද පුස්කොළ පිටපත් තිබෙන බවට සලකුණු තිබෙයි. මෑතක දී වර්තමාන ලියුම්කරුට ද ඒ ආකාර පුස්කොළ පිටපත් ලැබිණ.[91]

එය අනුරාධපුර පිහිඹියගොල්ලෑවේ කරුණාරත්න මහතා විසින් දෙන ලද්දකි. එහි අවසන් පත් ඉරුවේ සඳහන් ආකාරයට එම පිටපත කොකටියගොල්ලෑවේ කපුරාල කෙනෙකුට අයත් ඇත් දොස් කපන පොත ය. මේ තුළ ඇතුන් හා අලියන් අල්ලන ශිල්ප ක්‍රම මෙන් ම එම සතුන්ගෙන් ඇති වන උපද්‍රව හරණය සඳහා ද භාවිත මන්ත්‍ර ක්‍රම සහ කෙම් ක්‍රම අන්තර්ගතව තිබිණ. එයින් කීපයක් මෙහි සඳහන් කරනු ලැබෙයි.

**අලි එලවන්ඩ**

**ඕං නමෝ නාලාගිරි මුදුනේ උපන් නාලාගිරි දේවතාවනං මමය ගිනි සේ එන ජගත් දියසේ නැව නැවතී බැහැ දේවතාවා** බැහැ- ගිනි හුලට සත්විටක් මතුර අල්ලනු. පස්ස නොබලා දුවයි. ගල් මතුරා ගසතොත් හුලට මැතිරූ තැන දී මතුරා ගසනු. (පත්ඉරුව 'ක') දෙසඳුන් හොඬල අල තොලබෝ අල බොකිරෙන් පිරිසිදුව පංචෝපකරණයෙන් වටා නමෝ යන අකුරු ඒ බෙහෙතෙන් අතේ ලියා අත උඩුකුරු කොට 'සී' කියා ඇතුන් නවත්තනු. නේත්. " (පත්ඉරුව 'කි')

**අලින්ඩ ගල් මතුරා වැලලීම**

**ඕං පෙරදුටු අංගුලිමාලයින්ගේ සුවඳ ඇල් පඳුරක් ඇත. ඒ සුවඳ ඇල් පඳුර කාණ්ඩ අරක් කෙල්ලී කියන ඇතින්නිත්**

90 අලි පිළිබඳ විද්‍යාව, සංස්කාරක- ප.එ.ප දැරණියගල, (1952) ජාතික කෞතුකාගාර ප්‍රකාශනය.

91 පිහිඹියගොල්ලෑවේ කරුණාරත්න මහතා විසින් දෙන ලදි (2015)



**ගල්ලේ කුකු කියන ඇතින්නි දෙන්නා එන වෙලාවට පෙරදුටු අංගුලිමාලයෝ ගල් සතරක් මතුරා සතර කොණ තිබූ ආඥාවෙන් ආනුභාවෙන් මාගේ කෙත දෙස නොබලන්ඩ සර්ව ආරක්ෂා බන්ධන සිද්ධි කුරු කුරු ඒස් වඃ** අටෝරායියක් ගල් සතරකට දපා වළලනු සීමාවයි." (පත්ඉරුව 'කී')

**රළ බිඳුවා එලවීමට**

"ඕං ශ්‍රීන් අගන්තියානේ පොරුම් මේ මන්ත්‍රයෙන් මතුරා හූ කී කළ රළ බිඳී දුවත්." (පත්ඉරුව 'කෘ').

**අලියන් ලවා තම විරුද්ධකාරයාට අනතුරක් කරවීමට**

ඕං ක්‍රිං සිංහ සිවායා නම- දෙඹට මලට මේ මන්ත්‍රයෙන් සත්විටක් මතුරා කටේ තියාගෙන සිට බදවනට ඌ නැවෙන විට ඌ දෙස බලා දෙමට මල හපනු. දතින් ඔලුව පාගයි. මෙය කරන්ඩ එපා". (පත්ඉරුව 'කෲ')

**අත්පොලසන් දී ඇතුන් එලවීම**

ඕං එට්ටුත්තු කට්ටුත්තු සිංගවා කෝඩේන් නීත් ඔවඩන්නේ **පෝට්ටු පක්ෂියා ගාක්කෙඩෙන් සන්නිලේලුන්ද කනවති මුඛන් කොණඩුවන්දෙන් වාරි එන්දුම් පුඩියානේ වන්දු කෝමාන් වට්ටු වුඩන්කාරයානේ නගිලේ නඩුන් නාගා කන්නේරියාමේ කාන්දු කේලාවේ පෝග පෝග සිවාය නමඃ** අතට මතුරා අත්පොලුසන් දෙනු. ඇස් කන් නොපෙනී ගිය ගිය අතින් බිඳී දුවත්. රළ බිඳින මන්ත්‍රයි (පත්ඉරුව 'කෲ').

**උරමාලෙට මතුරා අලි එලවීම**

ඕං අරරාම පත්තිරා අයෝධ්‍යාපුත්තිරා අයියුම් කිලියුම් **අගේර පත්තිරානේ අස්ස ජගම් පට්ටු මූල වේ සිවාකා-** සත් වරක් මතුර උරමාලේ ගැටගසා පන්නා එන විට ඌට පෙන්නා දමා තමා දත ගසනු ඌත් දත ගසයි. ඇතුට අලියට. (පත්ඉරුව 'කෟ')

පත්ඉරු 13ක් සහිත මෙම පිටපත සම්පූර්ණයෙන්ම අලි ඇතුන් හා සම්බන්ධ යන්ත්‍ර මන්ත්‍ර කෙම් ක්‍රමවලින් යුක්ත ය. මිනිසාගේ ආරක්ෂාවටත් කුඹුරු වතුපිටිවල ආරක්ෂාවටත් ඒවායින්

කොටසක් වෙත් වෙයි. තවත් කොටසක් වෙන්ව ඇත්තේ ඇතුන් අලියන් අල්ලා හීලෑ කිරීමේ දී උන් පාලනය කිරීමට මන්ත්‍ර හා කෙම්ක්‍රම සඳහා ය. ඇතුන් අලියන් ඇල්ලීමේ දී භාවිත කරන මද්‍ර වලට ද මැතිරීමට මෙහි උපදෙස් සපයා තිබෙයි. මෙම පිටපත සම්බන්ධයෙන් පුළුල් විස්තරයක් වර්තමාන ලියුම්කරු විසින් අපවත් වී වදාළ මහාචාර්ය පූජ්‍ය හඟුරන්කෙත ධීරානන්ද ස්වාමීන් වහන්සේ වෙනුවෙන් පළ කිරීමට නියමිත කෘතියක් සඳහා සපයන ලදී.

**අලි හා ඇතුන්ට මන්ත්‍ර**

උක්ත ශීර්ෂයෙන් යුත් තවත් මන්ත්‍රයක් බෝගහවැව පුස්කොළ පොත් එකතුවේ තිබිණ. මෙම පොත් එකතුව මීට කලකට පෙර වර්තමාන ලියුම්කරුට පුද්ගලික වශයෙන් ලැබී ඇති එකතුවකි. වෙදපොත් යන්ත්‍ර මන්ත්‍ර ආදී විවිධ පොත් අතර මිශ්‍ර වූ පත්ඉරු රැසක් වෙයි. මේ අතර එක් පත්ඉරුවක මේ මන්ත්‍රය තිබිණ. ''**ඕං නමෝ නාලාගිරි මුදුනේ වැඩ ඉන්නා නාලාගිරි හස්තිරාජයා දැපනේ කළ ආඥාවෙන් එදා දල දිම්මි දේවතාවගේ ආඥාවෙන් සිටපන් බෝසතා සිටපන් ඇතා හිටවනු. ඕං නමෝ ගජං කටාට ගජතලා කටාට බහු කටාට බහු**'' දිග අඟල් 6 x පළල 1V ක් වූ මෙම පත්ඉරුව 'බ' අක්ෂර පත්ඉරුවයි. ඒ අනුව මෙයට අයත් තවත් පත්ඉරු තිබෙන්නට ඇත.[92]

ප.එ.ප. දැරණියගල මහතා සඳහන් කරන පරිදි පැරණි පුස්කොළ පිටපත් කීපයක ඇති අලි මන්ත්‍ර කිපයක් මෙසේ ය. ''ඕන් ශුටිමතා ගුලිජසු පුත්‍ර සිව සති ආනේ තැරි ගල් මතුර ගසනු. අතට මතුර අත්පුඩි ගසනු අලි යෙත්.[93] ''ඕං නමො භගවතො උපාදාන සයකුණ්ඩතෝය සෝරතෝ ගිරිමේබලා සබ්බස්ස වෛමැඩ නස්වා සතගු සදිනග ලොවුතුරා අරහං සිදධ ඇති මුවෙන් නොබැන බුස්සාන වැලක් කඩාගෙන මතුර ඇතාට අතින් ගසනු. පන්නා එනකොට හරහට දමනු දුවත්.[94]

92 බෝගහවැව සුද්දහාමි වත්තියක වේදරාළට අයත් පුස්කොළ පොත් එකතුව. දැනට වර්තමාන ලේඛකයා සතුවෙයි..

93 දැරණියගල . 1952 . පි. 43

94 එම.



**වස්ත්‍රයට මතුරා ඇඳීම**

ඕං පරවන පවන පෙක කර්ක- වස්ත්‍රයට මතුරා ඇඳගෙන යනු හස්තින්ගෙන් උපද්‍රව නැති වෙයි.[95]

**හුලට මැතිරීම**

ඕං ගනපොති කන්දකුමාර සිඃ ඕං පරවන පවන සම්මුඛා පරිපුර පාවනාය ඕන් උදධයිරවා ආසෝර වීර පත්‍රානන් මෙයින් හත්විටක් හුලට මතුරා අල්ලනු. ඇස පියා දුවත්.[96]

**ගල් වැලලීමට**

ඕන් නමෝ පෙරදුටු අංගුලිමාලයින්ගේ සුදු ඇල් වී පඳුරෙක් ඇත. ඒ ඇල් පඳුර කණ්ඩ අරක්කෙල්ලී කියන ඇතින්නිත් ගල්ලේ කුකු කියන ඇතින්නි දෙන්නා ආ තැනේ දී ඒ අංගුලිමාල කුමාරයා ගල් හතරක් මතුරා හතර කොණ තිබු ආඥාවෙන් ආනුභාවෙන් අදත් මගේ කෙත දෙස නො බලන්ඩ සිද්ධ බුද්ධ සීමා බැන්දෙන් ගල් හතරක් මතුර හතර කොණ වළලනු. මෙය ඉඩමේ ආරක්ෂාවටයි. කොටුවේ ආරක්ෂාවටයි. ගල් වැළලීමටයි.[97]

**නිදිකුම්බා ගස පලේ ගැසීම**

**ඕං හ්‍රිං ජීවනන්දනය සර්ව දිවා ත්‍රිං නං නමඃ ඕන් සන්දිඋරුවා කන්උරුවා මේස්වාහඃ** නිදිකුම්බා ගහ ගෙන නිර්වස්ත්‍රයෙන් අටෝරාසියක් මතුරා පලේ ගසනු. නිදත් පසුව දියට දමනු.[98]

**ලේන්සුවට මැතිරීම**

**ඕන් කදිර කුරු කුමාරයානේ පාඹු** ලේන්සුවට මතුරා ගැට ගසා ඇතුන් ඉන්නා ඉදිරියට දමනු. ගල් මතුර වළලනු. ඇතුන්ඩ යන්ඩ.[99]

95 දූරණියගල, පි . 44

96 එම, 44

97 එම.

98 එම.

99 එම.

**අලි ඇත්තු හා සම්බන්ධ වෙනත් කෙම් ක්‍රම**

ඉරිදා ඉබි බිජු ගෙන එඬරු තෙලින් අනා තියා අංකුසය පොවා හස්තින් අල්ලනු.[100]

"නයිශැව, කබල්ලැපොතු, මීඅන්කුඩු, කටුසු බිජු, සූනු බිජු, ඇටිකුකුල් බිජු, වඳුරු දිව එම සම් මේ හැම කොටා චූර්ණකර මැඩගෙන උතුකටු අඟුරෙන් නාහෙට දමා අල්ලනු. කම්බස් වෙයි. එවෙලේ ම පිටේ නගිනු.[101] (මෙහි උතුකටු අඟුරු යනු ශ්‍රී සුමංගල ශබ්දකොෂයෙහි 176 පිටුවේ දැක්වෙන පරිදි පොල්කටු අඟුරු ය).

"**ඕන් පුට්ටු පූට්ටු කාමලි පුට්ටු පූට්ටු අන සන්නි පූට්ටු ස්ටාපියානේ පූට්ටු** මේ දැහැනින් තිවිති දළුවලට මතුරා කටේ ලා යනු සැම කුලේ ඇතුන් නොවදිත්. නි බොරුයි.[102]

"බෝධිමුල් උදුරා පේ කොටගෙන තිදිකුම්බා කොළේ ඔතා ඉන තබා යනු. ඇතුන්ට නොපෙනෙයි.[103] "සතුරුසම්මට්ටි මුල් පේ කොට තෙලාගෙන සමලෙපටෙන් වෙලා ඉන තබා යනු. තනිකර නවතනු.[104] "මුරුංගා දළු තුනක් මුවෙන් නොබැන තෙලාගෙන ඉන ඇල්මේ තබාගෙන යන ඇතුන් මීවුන්ටයි.[105] අලඉසවල්ල, අළු කෙහෙල් ගහක්, එල ඔළිඳ ඇටේකුත් හිටුවා මුල් බැසුණු කල පුළුස්සා අලුත් කෙහෙල් ගොබේ අලුත් දෙවගේ අනා තලතෙල් ගා කෙහෙල් කොළ පොතේ බත් කා අලි පාරේ යනු. අලින්ට නොපෙනේ. මිනිසුන්ට පෙනේ.[106]

**ඇතුන් ගෙන්වීමට**

සමන් අලේ පොඩි කර අල්ලේ ගා ඇතුන් ගෙන්වනු.[107]

100 දූරණියගල, 39
101 එම, 39
102 එම, 52
103 එම, පි. 40
104 එම,
105 එම, 43
106 එම, 43
107 අඹතලාව සරත්, (1996) පි. 107.



**ඇතුන් නැවැත්වීමට**

ඉඟුරු අල, නියඳ අල, කොහිල අල, අක්මැල්ල කොළ, කරවිල කොළ මීතෙලින් අල්ලේ ගා ඇතුන් නවතනු.[108]

**අලි නොවැදීමට**

ඉරිදා ඉර පායන වේලාවට පළමුව දළුක් ගහට ගිය හීරුස්ස දළු තුනක් කඩාගෙන තනාපු කොළ අටුවට ගෙන ආරක්ෂාව පිණිස පිඳුරු යට තබනු. අලි නොකත්. බූත්සරණ දළුත් එසේමැයි. අලි නොවදී. යකිනාරං ලීය්‍ය අතින් කඩා යහදින් නොකපා අතින් ගෙන යන රසකිඳ මුදු තනා නොතලා අත ලා යනු. අලි නොවදී.[109]

**වෙඩි නො වදින මන්ත්‍ර**

පුරාණ කෙම් ක්‍රම අතරේ යන්ත්‍ර මන්ත්‍ර ඇතුළු ව තව ද අභිචාර විධි නොයෙක් නොයෙක් කාරණා සම්බන්ධයෙන් භාවිත ව ඇති සෙයක් පෙනේ. තම ආරක්ෂාවට විවිධ උපක්‍රම භාවිත ව තිබෙයි. ඒවා අතර වෙඩි නොවදින මන්ත්‍ර ද තිබෙයි. මෙයින් නිදසුන් කරනුයේ වෙඩි නොවදින මන්ත්‍ර කීපයකි. මේවා ද පැරණි පුස්කොළ පිටපතකින් ලබාගත් ඒවා වෙයි. මහනුවර ආදාහනමලුව විහාරයේ පුස්කොළ පොත් අතර තිබුණ යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් පොතින් උපුටා ගන්නා ලදි. මෙහි ඇති තවත් විස්තර වර්තමාන ලේඛකයා විසින් මීට පෙර පළ කරනු ලැබ තිබෙයි.[110] ඉන් කීපයක් මෙහි ද අන්තර්ගත කෙරේ.

**වෙඩි නො වදින්ඩ**

**ඕං නමෝ සිද්ධාර්ථ කුමාරයාට වසවර්ති මාරයා තිබූ වෙඩිල්ල නැවැත්තු වේදනං රුසියාගේ ආඥාවෙන් ආනුභාවෙන් අදත් මොහුගේ වෙඩිල්ල පත්තු නො වෙන්ඩ වේදනං රුසියාගේ වරම්- හුනුමතුර අතේ ගානු. ඕං වේදනං රුසියා ඇරිය ගිනිවෙඩි**

108 අඹතලාව, සරත්, (1996) පි. 107.
109 සාරථී 9 කලාපය (2011). ම. ප. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව. වයි.කේ. තිස්ස බණ්ඩාර - පැරණි පුස්කොළ පිටපත් ඇසුරෙන් වෙඩි නො වදින මන්තර සහ තවත්..... පි. 157.
110 එම

දහසක් බෝමිනන් දේවතාවි වමත් දකුණත් පැ අමත්තු කළ ආනුභාවෙන් ගිනිගෙඩි තඩුත්තු ජ්ස්වාහඃ ඕං අගනීල කට්ටු එං පෙරුම් කට්ටු දලාගණී බැන්දෙන් තාගේ විඳු වෙඩි ශරේ නාන් ග්‍රහණයට පලංචි නැති නිකං ඉඳු- හුනු මතුර අල්ලේ ගා මිට මොලවනු. කිල්ලෝටේ දමා ඉන තබාගෙන යනු වෙඩි නො වදියි.[111]

ඕං නමෝ වළගං බොලගං හනුමන්තාගේ ශරේ තහන්දි තඩුත්තුයි ඕං කුක්කුන්ඩ නම් දේවතාවගේ ආනුභාවයෙන් ආඥාවෙන් මරින්දු තඩුත්තු තඩුත්තු ජ්ස්වාහඃ..... මේ දෙක තැඹිලි ගෙඩියකට සත්විටක් මතුරා ගහ අග බැඳ වෙඩි තියා බලනු. අත් දෙකට මතුරා මිට මොලවා කිසිල්ල පුට්ටුකර සිටිනු. මේ මන්ත්‍ර ලියා ඊට සුදුසු යන්ත්‍ර ඇඳ මතුර ඉන බැඳ යුද්දට යනු.[112]

**වෙඩි තබන්ඩ**

"**ඕං නමෝ දේව රජ්ජුරු දෙවියෝ හනුමන්තාට ඇරිය ශරේ හනුමන්තා ගසාගෙන ගොස් සත්මුදකින් ඒ දෙසේ ක්‍රි මුහුද මැද්දේ ඉන්නා කන කැස්බෑවාගේ ලෙයි ඇනී පිටත්වුනු ආඥාවෙන් ආනුභාවෙන් මගේ වෙඩි ශරේ නොනවතීවා**- මින් මතුරා තමාගේ තුවක්කුවට දමා යුද්දෙට යනු.[113] මන්ත්‍ර සහ යන්ත්‍ර තවත් කීපයක් මෙම පිටපතේ තිබෙයි. මේ ආකාර පිටපත් පුස්කොළ පොත් අතර දුර්ලභ වෙයි. පුස්කොළ පිටපත බලනු කැමති අය අදාළ විහාරස්ථානයෙන් විමසනු මැනවි. යන්ත්‍ර මන්ත්‍ර සහ තවත් විස්තර සඳහා ඉහත මූලාශ්‍රයෙන් ද දැන ගැනීමට පුළුවනි. මෙහි සූනියං නො වදින්ඩ අංගං නො වදින්ඩ ආදි කාරණා වෙනුවෙන් ද යන්ත්‍ර සහ මන්ත්‍ර තිබෙයි. ඉන් කීපයක් මෙසේ ය.

**සූනියං නො වදින්ඩ**

"**ඕං ශ්‍රි ත්‍රි ශුලත්තී පුර චක්‍රවර්ති මන්ත්‍රී**- තැඹිලි පොල් කුරෙන් උප්පත ලියා මන්ත්‍රය දැන වදකහ පැලේ එක්ක අකුලා ඉනේ තබා යනු. සූනියං නොවදි.[114]

111 සාරථි 9 කලාපය පි. 161
112 එම.
113 එම, 160
114 එම, 159



**සූනියං අංගං නො වදින්ඩ**

යොං තුඹකොළ පිලමුල් කොටකිඹුලමුල් අබ මිරිස් පැහි උයා අවුරුද්ද නැගිදා ඉස්සර වලදනු- වළල මුදුවට අඩිස්සිර කර අතේ තියා ඉදිනු. අත්දුටුවයි. අංගං නො වදි. ඇහැළ මුල්, පොතු, දළු, හරංකහ අල මේවා අඹරා තබා ඇගේ ගානු. සූනියං, අංගං නො වදි.[115]

**ඕං නමෝ සත්මූදකින් ඒදේසේ ශ්‍රී නාරං බිසවුන් වහන්සේගේ ආඥාවෙන් ආනුභාවෙන් අත්වැලකුත් පාවැලකුත් එකසිය අටක් ක්‍රම සූනියන් කටු අංගං පොර අංගං ශර අංගං වෙඩි අංගං පිඹින අංගං අතු අංගං අහස බඳින් පොලොව බඳින් අහස ගුගුරුවා යන ලෙස සුළං බඳින් මෙතැනට නැත එතන සිට පලයං**- අංගමට තෙල් හඳුන් මතුර ගානු. නො වදි.[116] කාමරංග මුල්, රසකිඳ මුල්, හරංකහ තැඹිලි දියෙන් මතුරා ගානු. අංගං, සූනියං නො වදි.[117] **ඕං නමෝ ගිනිජල් දේසේ අස්ගිරි පර්වතේ වාසස්තානේ කරන කන්ද නම් අසුර දේවියන් වහන්සේගේ දිපීයී අසුර කුමාරයා දසදහසක් සක්වල එල්- උඩින් එන පාරේ නාවත්වා ගැයූ ආනුභාවෙන් ආඥාවෙන් ආපසු පලච්චි පොඃ**- සඳුන් මතුර කම්මුලේ ගානු. නලලේ ගානු. අංගං නො වදි.[118]

**අංගමෙන් වැටුනාම**

"**ඕං නමෝ ගුරු ඕඩිවා ඕඩිවා ගුරුල ඕඩිවා කුඩුත්තු නෙයියාඩගං මාවා සච්චි පොච්චි පෝවා පෝවා නැති නැගුටු නැගිට සිටිවු**- අංගමෙන් වැටුන ම අතට මතුර ගසනු පැං මතුට ඉසිනු"[119] අංගං සම්බන්ධයෙන් යන්ත්‍ර මන්ත්‍ර කෙම් ක්‍රම තව ද මෙහි තිබෙයි.

115 සාරථි 09 කලාපය, 162
116 එම,
117 එම,
118 එම, 164
119 එම, පි. 163

**හිරගෙයින් නිදහස් වීමට**

ඕං නමෝ මහා දේවී පුත්තං ත්‍රිරේස්වාහඃ මේ මන්ත්‍රයෙන් නම විධාන කොට දඟගෙයි උන්ගේ නම ලියා ඔහු බන්ධනයෙන් මිදෙත්වායි ලියා ඒ පත කකුළුවකු ඇති තැන තබනු කකුළුවා සරා ගිය කල දඟගෙයින් මිදෙයි.[120]

**සියලු කර්මාන්තයට**

ඕං ගුරුධරනේස්වාඃ- ඕං කාලධරනේ ඒස්වාහඃ- දිවහැරනේ ඒස්වාහඃ- හවිධරනේ ඒස්වාහඃ- අවිය්ගුරුධරනේ ඒස්වහඃ- ඛණධරනේස්වාහඃ- නක්ඛ නව-ං සාරිපුත්ත මොග්ගල්ලාන වර්ෂ ජීවං ඒස්වාහඃ- කර වැඩ කිරීමට, බත් කැවීමට, කන් විදීමට, උළුවහු පැනීමට, මල්වර උනාට, වැව්පස් ලන්ට, මැඩිපනුවන්ට, ගෙබිං ගෙවැද්දිමට, දංගන්ඩ, ආසන නැගෙන්ඩ, පිළිමකරන්ඩ, නෙත් පිහිටුවන්ඩ, දාගැබ් බඳින්ට, පතල්, පොකුණු, අගල් කපන්ඩ, නෙත් කළුමදින්ට, මෙකී සියලු කර්මාන්තයන්ට සැකසූ මන්ත්‍රයයි."[121]

**විවිධ කාරණා සඳහා**

විවිධ කාරණා සඳහා භාවිතයේ ඇති යන්ත්‍ර මන්ත්‍ර කෙම් ක්‍රම සමහර ඒවා යම් යම් ලේඛනවල තිබෙන බව පෙනී යයි. පුස්කොළ පිටපත් මෙන් ම අනුලේඛනය කර ඇති අත්පිටපත් ද ඒ අතර තිබෙයි. මුද්‍රණයෙන් පළව ඇති සමහර කරුණු කිහිපයක් ද මෙහි දක්වනු ලැබෙයි.

**මීයෝ නො කන්න**

හිරු උදාවන විට පිරුවට ඇඳ පේ ව සිට කිරිබත් කා වැලි මතුරා පිටු පා පාන්දර කෙතට ඉසින්න. මුඛ බන්ධ ඒස්වහඃ. මීයෝ නො කත්.[122]

**මට්ටයන් නැතිවීමට**

ගලක් මතුරා දමන්න. ඕං නමෝ යටටු විස්සක් කට්ටු කක් එලෝධීර ඕඩු ඕඩු ඒස්වාහඃ [123]

120 සාරවී 09 කලාපය. 164
121 එම
122 අඹතලාව (1996). පි.106
123 එම.



**කිඹුලට**

නමෝ වලේ ඒස්වහඃ [124]

**අලියට**

ඕන් සක ඔලින රාජනේයි. ඕං වත්කිනි ජානේයි නාගිශායි [125]

**අලියට**

ඕන් වයිහාර ඉෂ්ට දේවි ප්‍රමාධී ඕඩි ඕඩී මේරමන්තුමා පේසු ලයිලනාල යක්ංය කැපකර නරසිංහ දිෂ්ටි දිෂ්ටි හරිහර පුමේස්වර සූරියානේ දිරි [126]

**බල්ලා කෑවාට තෙල් මතුරනු**

නමෝ ඉන්ද්‍ර බ්‍රහ්ම ඒස්වහඃ [127]
එයටම : ඕං හීම් කෑවා හීම් විෂහින[128]

**බල්ලන් නො කා වැළැක්වීමට**

නමෝ කරයුරු මුඛ බන්දන ඒස්වාහඃ[129]

**මීයන්ගෙන් වෙයන්ගෙන් ආරක්ෂාවට**

ඕං කට යේස්වහඃ මේ මන්ත්‍රයෙන් අතට මතුරා එම ද්‍රව්‍ය අතගානු.[130]

**බල්ලාට**

ඕන් අලරිය වායුම් එරවේලුම් ගොරවන නානේ අලවනේ රෝවරි තරි මුනියා තරි බුරා එනවිට ලේනසුව ගැටේට මතුරා අනිත් කරට දමනු වැටෙයි. අසුර ගසනු ගොලුවෙයි.[131]

124 අඹ තලාව. 107.
125 එම.
126 එම.
127 සිරිසේන. (2006). පිට 37.
128 එම.
129 අඹතලාව. (1996). 107.
130 එම.
131 දැරණියගල ප.එ.ප. (1956). පි. 51 (සර්ප වෙදකම).

**ගෝනුස්සා කැවාට**

ඉනේ රෙද්ද පිට පෙරලා අඳිනු.[132]

**අනින්ඩ එන හරකුණ්ඩ**

ඕන් ආනන්ද ගිනිකාලි කලුකම්බිලි බහිරවයානේ අප්පා පෝඩු.... ඕං කාක්කා පරක්කා කරවලා ඉරක්කේම්බුවලිනි කණ්ඩා විල්ලු විල්ලු අම්මා විල්ලු විල්ලු. [133]

**හුංගෝ අනිනවාට**

ඕං සිරිමුඛ සිරි ඵුඃ හුන්ගෝ අනිනවාටයි උල්කෙන්ද පට්ටා උගුල්ලා මුද්ද තනා ඇඟිල්ලට දමා කරක් ගසනු.[134]

**විත්තිකරු පරද්දන්ඩ**

ඕං නම් කාකා ස්වාමි පූට්ටු ලන්කා පූට්ටු දිගුරුවා පූට්ටු ඒස්වාහඃ සභාවට යන විට විත්තිකාරයගේ නම කුරුම්යෙන් කෑ පත ලියා රූපේ ඇඳ හත්වරක් හෝ එකසිය අට වරක් මතුරා අඟුරු දූම්මල අල්ලා හුඹස් කටේ ඔබා පිලිමෝලෙන් ඇන තද කරනු. විත්තිකාරයන් පරදිත්.[135]

**පිස්සන්ට**

පිස්සන්ට මෙයින් මතුරා පිසදමනු. ඔන්න කයිප්පු වෙප්පුල් කන්දප්පිය සච්චි උඩ නොල පුස. [136]

**එඳිරිකාරයාට**

මේ මන්ත්‍රයෙන් අතට මතුරා නාලීය අල්ලා ඔබනු හතුරා දුවයි. ඕං නමෝ ත්‍රීනම් ආතේතාම් ත්‍රිවාත් වාරං පංඬු [137]

132 දැරණියගල (1956). පි. 162.

133 බෝගහවැව පුස්කොළ මන්තර පොත. 2 පත්තිරුව.

134 බෝගහවැව මන්තර පොත :1 අවසන් පත්තිරුව.

135 දැරණියගල. 1956, 45 (සර්ප වෙදකම)

136 අඹතලාව. පි. 108

137 එම.



**කටහඬ හා නුවණ වැඩීමට හා සක ශාස්ත්‍රයේ නිපුන වීමට**

ඕං ආරාජේවිර ජෙ ශුඬෙ විශුඬෙ ගෝදය විමලේව මජය වාහිනේ රථ රථ වාලේන ඕං වාත පට්ට පුලේස්වහඃ අවශ්‍ය කාරණය සඳහන් කරනු.[138]

**තෙල් ඇතිළියට අත දැමීමට**

ඕං නමෝ සත්මුදකට ඒ දේසේ කිරි මුහුද මැදදේ එරන්ද ගොඩනැගිල්ලක් ඇත. එරන්ද ගොඩනැගිල්ලේ බක්මී ගසක් ඇත. ඒ බක්මී ගස යට ඇලි කිඹුලෙක් ඇත. ඒ ඇලි කිඹුලාගේ බඬේ සෙවල මාගේ අතේ ඇටලය... අදත් මේ ඇතිලියේ තෙල් මාංශ අතට සිසිල් වේවාඃ[139]

**තෙල් පිරිමැසීමට**

මේ මන්ත්‍රයෙන් තෙල් මතුරා කැවිලි සඳහා ලිප දැල්වීමට දෙනු. තෙල් පිරි මැසේ. නමෝ වජ්‍රපාණිපානලේ එස්වාහඃ[140]

පහන් තෙල් පිරිමැසීමට

එම මන්ත්‍රයෙන් තෙල් මතුරා පහනට දමනු. නමෝ ඔල විමලේස්වාහඃ [141]

**ඉසරදයට**

ඕං නමෝ තඩමක්කුරි කඩමක්කුරි කුඩමක්කුරි කුඩම්ක්කුරි බදුරහාන්දුන් හේ කුංඩුම් මුල්ලා බහුතුං- ඉසේරුජාවල් බඩරුදාවල් ගුල්ම රුජාවල් සියලු රුජාවල් පොලොවට හංග හංග ඒස්වාහඃ- [142]

**දත් කැක්කුමට**

සබ්බපාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා සචිත්තපරියෝදපනං ඒතං බුද්ධානු කීතෝස්වාහඃ දත් කැක්කුමට යකඩ ඇණේ හත්වර මතුරා ගහක දිත තියම කර ගසනු. සත්තයි.[143]

138 අඹතලාව 112.

139 එම 110.

140 එම.

141 එම.

142 උපනන්ද හිමි, පි. 58

143 එම

**එයටම මන්ත්‍රයක්**

"ඕන් ගුරුවේ ගුරු **ඉස්පායාල් සා නෝයියා මදුර මැදුරු කෙරේ ගොජිනිවා කෙරේ පාකුළු කට්ටු ඕං තිබාහන්නේ වෙසමුනි බාගන්නේ ස්කන්ධකුහමාර බාහන්නේ හනු හනු යගන්දතු භූත වීර හනුමන්තා නමඃ** [144]

**දත්වෑයට**

ඕං නමෝ **සිරිස්වාහඃ** දත්වෑයාට බුලත් මතුරා දෙනු.[145]

**ඉසරදයට**

රබ්බඩ පුවක් ගෙඩියක් ගෙන ගිරේට අල්ලා ඉසමත තබා මේ මන්ත්‍රයෙන් 108 වරක් මතුරන්න. **ඕං නිල යෙලෙක්කුං කයිල සෙලෙක්කුං සුලච්චි සුළු පෝග පෝග ඒස්වාහ** මෙසේ මතුරා පුවක් ගෙඩිය දකුණු අත දිගේ ගෙනත් මහ ඇඟිල්ලේ නියපොත්ත උඩ තියා කපනු. ශුභ වෙයි.[146]

**ඉසේ කැක්කුමට**

**නමෝ යකිනි ඒස්වාහ- නමෝ අග්ගිනි අග්ගිනි ඒස්වාහඃ-** හිසේ කැක්කුමට කපුට අඬන්නට පළමුව තලතෙල් හත් වරක් මතුරා නැති අංශ කණට වක් කරන්න.[147]

**ඉරුවාරදේට**

**බයං විරාගං-** යන ගාථාවෙන් රෑ උනාට පසු තුන් නූල් ගෙන මෙම ගාථාවෙන් 108 වර මතුරා ගැට හතක් ගසා ඉරුවාරදේ ඇති අයගේ පයේ මාපට ඇඟිල්ලේ නූල බඳිනු. සත්තයි.[148]

**අතීසාරයට**

නමෝ ආයි දැඩි උපා දැඩි- කලයේ පැනට අටෝරායියන් දපා කට බැඳ මුනින් නවා තබන අතීසාරයට අත්දුටුවයි.[149]

---

144 උපනන්ද හිමි, පි.58

145 එම

146 එම 33

147 සිරිසේන, 2006. 37

148 එම 36

149 සාරපී 9 කලාපය 2011 : 159



**විරේකයට**

**ඕං නමෝ කුඩිත්තු නික්කෝ ඒස්වාහඃ** විරේක සිදුවනු නාමෝ.[150]

**වමනයට**

**වතුන්ද බුද්ධි බුද්ධීස්වාහඃ** මින් වමනය සිටුවනු.[151]

ගුප්ත ශාස්ත්‍රය හා බැඳුණු යන්ත්‍ර මන්ත්‍ර කෙම් ක්‍රම ඇතුළු අභිචාර විධි හොඳ මෙන් ම නරක කටයුතු සඳහා ද භාවිත ව තිබෙයි. එකී දේ මුඛ පරම්පරාවෙන් පවත්වා ගෙන ඒම සිරිත වුව ද සමහර ඒවා ලිඛිත ව ද තිබේ. පුස්කොළ සහ අත්පිටපත් මෙන් ම අනුලේඛනයෙන් පසුව මුද්‍රණයෙන් පළව ඇති මූලාශ්‍රය ද මේ සඳහා පවතී. ඉන් කීපයක් මෙහි දැක්වෙයි.

**හතරහන්දි කොර වීමට**

හොඬල අලෙන් රූපේ තනා නම ලියා නිලවල බිත්ද පැඟිරි කටු පස්වගේ ගෙන එකසිය අට වරක් මතුරා කටු ගසා උඩින් පත්නවා ගල ගිගිරානෙක යට කරනු සතර හන්දි කොර වෙයි.[152]

**සත් දවසින් මරණයට**

**ඉමං පාකාරං** යන ගාථාව පොල්කූරට එකසිය අට වරක් මතුරා දෙහි ගෙඩියට ගසා තියා දෙවනුව ගලවා තියා නැවතත් සත්වරක් මතුරා ඇඟට අනිනු. නයි විෂ විදියෙන් මරණය යි. නොකරනු. දිවිකදුරු කොළේ රූපේ ඇඳ එකසිය අට වර මතුරා කතුරෙන් කපනු සත් දවසට මරණයි.[153]

**දෙන්නා වෙන් කරන මන්ත්‍රය**

**ඕං කෘම්ජුල ජුල පුන පුනිය කාපුවත** කැලියාලය. මෙහි ක්‍රමය නම්,


---

150 සාරපී 09 කලාපය, 2011, පි. 159

151 එම

152 බෝගහවැව මිශ්‍ර තනි පත්තිරුවක් 'කු'

153 එම



මේ යන්ත්‍රය කොළය ලියා දිය යටින් තාරකාවෙක් නියමට බලා යන්ත්‍රයට මතුරන ඒ වෙලාවට තාරකාව ගිලෙයි. යන්ත්‍රය බැඳ පනිනා කඩුල්ලේ පනින තැනම වළලනු. වෙත් වෙත්.[154]

**මඟුල් කඩන මන්ත්‍රයක්**

**ඕං ඉලක්තුක්කුඩ පිරි ඕං කාලි මන්ත්‍රකාලි කාලත්ත්‍ර ඉනා පුට්ටුනයනේ ඔලිසුම්ක්කාල් තොට්ටිච්චිල් අම්මා කීලේ ඇරේ සෙත්තුමුට්ටිත්‍රුංශි කාම්ත්‍රුං ශිවන්ද අනුලංතං තිරිල් තාමරේ සෙත්තප්පෝලේ අවං සසියුං කඩමේ සිවාකඃ ඕංදාලි භානුදමාලි පාදම්මාලිභානු මූනුරං භාන්දූ තුබුනෙලූලා ඉල්ලාහන්දූ මේතං ඔදූ සුදූලාහිකේ භාන්දූ ඩවුන්කේ භාන්දූ අලිකේ භාන්දූ තෙල් රූපදකම් භාන්දූ භාරිකේ භාන්දූ සුබදියාමු භාන්දූ භාන්දූ සිවාකඃ** ගෑනිගෙ අතින් පුවක් ගෙඩියක් ඉල්ලාගෙන 408 වරක් මතුරා මඩිස්සලේ දමා බැඳ තියනු. මඟුල් ඇරෙයි සත්තයි.[155]

ගුප්ත ශාස්ත්‍රයේ ඇති වශී ගුරුකම්, ඉනා ගුරුකම් ආදිය එලිපිට නො කර රහසිගතව සිදු කරනු ලබනු එක්තරා අභිචාර ක්‍රමයකි. කුමන කාලයක සිට මේවා ආරම්භ ව ඇත්දැයි නිශ්චිත නැත. එහෙත් විවිධ ප්‍රාදේශීය වෙනස්කම් සහිත ව මෙන් ම විවිධ ගුරුකුලවලට අයත් ඉහත ගුරුකම් වර්තමානයේ ද ජනප්‍රිය

154 බෝගහඩැව මන්ත්‍ර පොත

155 බෝගහවැව සුද්දහාමි වන්නිනායක වෙදරාලගේ ඇක්සැයිස් අත්පිටපත මේ අය 1959 දී අභාවප්‍රාප්ත්ව ඇත. පැරණි පිටපතකින් හෝ ශ්‍රැතියෙන් ලියාගන්නා ලද්දක් විය හැකි ය. දැනට මෙය මෙම පර්යේෂක සතුව තිබෙයි.



ව ඇත. පුවත් පත් සහ වෙනත් මාධ්‍යය තුළින් මේ සම්බන්ධ ව ප්‍රචාරාත්මක දැන්වීම් අනුව එය තහවුරු වෙයි. ඇතැම් අය මලයාලි ගුරුකම් වශයෙන් ද රොඩී කුලයේ නීච ගුරුකම් වශයෙන් ද මේවයින් ඇතැම් ඒවා විස්තර කෙරෙයි. ජනශ්‍රැතියෙන් පැවත ආ සමහර මන්ත්‍ර හා ගුරුකම් ක්‍රම ලේඛනය කර ඇති අයුරු ද පෙනේ. ඒවායෙන් කිහිපයක් මෙසේ ය.

**වශී මන්තර**

**ඕං කාක්ෂ බිසවුන්ගේ කරඬු සතකට එල්ලෙනා එක කරඬුවක් ඇත. ඒකේ මැණික් කරඬුවේ වාසස්ථානේ කරන කුමාරිකාවට පිඹින ගින්ජාලේ අදත් මම පිඹින්නේ මේ ඉස්ත්‍රියගේ සියලඟ ගිනිජල් වෙලින් යන්නට එන්ඩ මල්මදන දෙවියෝ සත්දෙන්ගේ වරම්** සත් වරක් මතුරා ඇඟ ගාතු ලඟට එත්.[156]

**ඕං නමෝ සත්මුදකට එකර ඒ දේසේ කිරි මුහුඳ මැද්දේ වාසස්ථානේ කෙරෙන ගිනිජල් බිසවුන් වහන්සේගේ බඩේ තිබුණු වනේ කටුවය ආරුවට මම ගසන්නේ මෙකී ඉස්ත්‍රි පුරුෂයින්ගේ ( - ) රෝම කුප්පයෙන් ජල මල නව දොර අඟුල් සතර යද්දිනි පුට්ටු හිටු ගිනි ගිනි හිරය ඉස්ත්‍රි පුරුෂය මූත්‍ර කරපු තැන** යකිනාරං කටුවට මතුරා ගසා තියනු. වෙත් වේ. හිර බන්ධනයි. අත්දුටුවයි.[157]


වශියක්

ඕං කරමෙල්ල උඩය අවතිරුමානේ ඉන්වේට් (-----) ඖන්සූ අයිපුල අඩකිල්ල එන් වශමා කනික කනික ස්වාහඃ දැල්ලේ අපෙ ආදා අන්කරම ආද. එකසිය අට වරක් මතුරා ගෑනිගෙ ලැපැත්තේ අත තියනු.[158]

156 බෝගහවැව වශිගුරුකම් පොත පත්තිරුව 'ක', දැනට පර්යේෂක සතුව තිබෙයි.


157 එම, කි, පත්තිරුව

158 එම, කි. පත්තිරුව



**වශියක්**

ඕං අකිලේස්වාහඃ නිමි නිමි තෝස්වාහඃ මේ මන්ත්‍ර දෙක ආ උන්නෝ මූණේ ගා බලනු. කැමති වෙයි.



ඕං ශ්‍රිරිං සිරි කට්ටු මේ මන්ත්‍රය බුලතේ ලියා ගැනිට කන්ඩ දෙනු. කැමති වෙයි.[159]

159 එම. කු. පත්තිරුව



**වශියක්**

ඕං සොමකන්ද කුමාර වර මණ්ඩා ආක්ෂරය යමදේව මූර්කුමාර වර වර මේෂ වෘෂභ දිෂ්ටි වර වරම් තුන්කලට කයින්ද දිෂ්ටි වර වර යා අවතාරගිනි ගෙන පුපුර පුපුරාගන් යමදොර අගුලු ඇරිය වර වර මූර්බුමාර නමඃ.... ඕං ගිනිදෙවෙල් අවතාර දිෂ්ටි වර වර කන්‍යා තුලා වෘෂ්චික ද්ෂිටි වර වර ධනු මකර දිෂ්ටි වරං මහමෙර එලිකරව් වර වර නමඃ.... ඕං රීරිගල් කොවිලේ ඉන්නා රීරිගල් දේවතාව දිෂ්ටි වර වර කුම්භ මීන දිෂ්ටි වර වර අට සුමදෙන යකුන්ට මහසොන් දේවතා දිෂ්ටි වර වර නම දිෂ්ටි මුරිනමඃ.... ඕංහිං යමදේවගති අවතාරයෝ දිෂ්ටි වර වර ඉරුැඨස් කොවිලේ තොයියට වර වර සප්ත වින්සති මහි නක්‍ෂත්‍ර දේවතා ආවේස වව්.... ක්‍රාං ක්‍රාං ක්‍රාං ක්‍රාං නමාඃ.... ඕං හීව්කාර නමඃ.... ඕමූර්ද කුමාර නමඃ.... ඕං විෂ්ණු දිෂ්ටි කන්ද කුමාර දිෂ්ටි හිමාල දිෂ්ටි සූර සූර දිෂ්ටි වර වර නමඃ.... යක්ෂ දිෂ්ටි හනුමා දිෂ්ටි වර වර ඒස්වාහඃ.... ඕං ඓං ග්‍රිං ග්‍රිං කොලියෙස්වාහඃ.... සඃං මන්ත්‍රකාලි පත්තකාලි ඔඩිසියානේ ඔඩ්ඩියාකිබලයේ ඕන් නාවිසි නාරේ පිඩුන්ඩේන් මාමඃ.... සෙනසුරාදා පිරුවට ඇඳ තල, එළකිරි වේලා, කොටා, තෙල්යිඳ කිරි ඇති ගසක් මුල දී වත්, තුම්මන්සලක දී වත්, පැන්නෙවෙද වත්, මල් බුලත් තටුව තනා, රත්මල්, සුදුමල්, බත්, කිරිලේ, තල, මුනි විලඳ මේවා එක ගොටුවක ගෙන අට කොනක පසු ඉස මුදා නිර්වස්ත්‍රයෙන් දපා ඉද පළම තලතෙලට අටතුරසියක් මතුරා දකුණු යටිපල්ලේ උල්කටු මුනෙන් ඇද ගින්නට පයලා අල්වනු. දයා උණුවෙයි. පිස්සියෙන් එන් අවහම කාලම පිසිනු. දුනුකේ හපු පිච්ච නාඹුල් බුලත් මේවා මතුරා දෙන රෙද්දකට මතුරා දෙනු. වෛශ්‍යවයි.[160]

**ඉනාවක්**

ඕන් කඩු පුඩු මංඩබමාල් ඔරුකාල් මුන්දල මුන්නිල දෂ්ට සුකේන්ගානීල සූං ක්‍රාංපන්නන්ඩු ඔරු ඔරු පූරෙපුපාට්ටු භාවර කඩිතේ කනකනිඩේ තිරයූම් කණ්ඩා නාරායනේවා ඉයියානේවර ඉන්නේවා මල්මදන දේව්වා ඉරන් සිවනේ අරිනේ කනඨතාක් කුරං දං අංදං මල්එවල් කරඩු දෙක දෙක කිය කියා සිරඩුගෙ

160 බෝගහවැව මන්ත්‍රපොත :2 පත්තිරුව ,ක,

පලු දිෂ්ටියෙන් වන්නේ ශී මහා උඩ අගනි මදන යක්‍ෂණී වාවා අසි අසි කොන්ඩුමා එරූ භූසල කිරුහන්නේස්වාඃ සුදු පිරුවට ඇඳ, තල තුන් මිටක් ගෙන කොටා, මිරිකා, තෙල් ගෙන මීනී ඔළුවකට වක්කර ඊට ඌසිකන්දෙන් ගෝරෝචන තයිඔළු ටිකක් කුඩුකර දමා කදුරුකන තුනෙන් ලිප බැද පස් පැගිරි දමා ගිනි කර බුබුලු නැගෙන විට මල බුලත් තට්ටුව පිට තියා නිරිවස්ත්‍රයෙන් අටෝරාසිවරක් මතුරා තීන්දු වෙන වෙලාවට ඉර මුදුනට එන නවසියවරට ලේ ගෙටුවක් ඉස්සර පිට තබනු. ඕනෑ ස්ත්‍රියකට තැඹිලි පොල් කුරෙන් ඇඟ ගානු. ඉනා වෙයි.[161]

**තවත් ඉනාවක්**

ගිනිකාලි මේහිණී අම්මා වාවා ඉන්දිරකාලි මනුදේවතාවි ස්මදන කොරාඩුම් පත්‍රාකාලි අම්මා වාවා ශ්‍රී නාරායෙන් කදිරවේ ලීලා පොට්ටප්ප කොණ්සුවඃ...... තැඹිලි පොල් එකසිය අට වර ජීවං කර ඇගේ ගානු. ඉනා වෙයි. සත්තයි.[162]

**තවත් ඉනාවක්**

ඕං හිරන් තාමණ්ඩේ තුරුතු සර්වවේවාසන් තුරු කුරු කුරේස්වාඃ නොයිඳුල් බුලතට මතුරා තමාට ඕනෑ ගෑනියකුට කණ්ඩදෙනු ඉනා වෙයි. සත්තයි.[163]

**වශියක්**

නමඃ ශ්‍රී සරණාය- ඕං ආං සෝර වීර පත්‍රකාලි දිෂ්ටි හනුමා දිෂ්ටි අංජන දේවි දිෂ්ටි දැඩිමුඩදේවතාවි දිෂ්ටි වර වර ජ්ස්වාහඃ- හැම මන්ත්‍රයම ජීවමයි- ඕං සර්ව මන කුන්ද කුන්ද ගන්ද ගන්දනේ හීනෙස්වාහඃ- නෑඹුල් බුලත් හතක් ගෙන මතුරා දෙනු. වෛශාවයි.[164]

161 බෝගහවැව සුද්දහාමි වන්නිනායක වෙදරාලගේ ඇස්සැයිස් අත්පිටපත පි. 43

162 එම, පි. 44

163 එම.

164 බෝගහවැව මිශ්‍ර තනිපත්තිරු දෙකක්




**ස්ත්‍රී වශියක්**

සස්සුවාඃ කදිරගධාරනි විහුෂනි නාංග ආනාර කාමරූපනි හස්ති රාක්ෂභූත නන්දනි ගිනිමල් රාක්ෂි ලේපිල්ලි රාක්ෂණී මේ කෙලි බාරයි චණ්ඩාලකෙලී මගේ යහානාවට නාවානං ඇගේ සත්තැලියක් ලේ උරාබොන්නට පිල්ලි රාක්ෂිට භාරයි- අම්මේ අම්මරසිලා ලේ බී රොස්ස බාරේ සරණපාවා දෙන් වෙසමුනි රජ්ජුරුවනේ අඩතුන්කෙලක් බිසවුන්ට නායික අග්නිරූපනීතං බිසවුන්ට බාරයි බලකාමි රතනාම් අංගකාලි නිලි අම්මා සුරංගි අම්මා සුරකුවා සුරකුවා නලකොළ පොතේ රූපේ ඇඳ සුද්ධ තැඹිලි තෙල් පාන දල්වා මලබුලත් තට්ටුවේ තබා මතුරන කොට වරක් කියවෙන කොට පානට අල්ලා රත් කරනු. එකසිය අට වරක්. ස්ත්‍රී වෛශ්‍යාවයි.[165]

**දබරකරන්ඩ**

මේ යන්ත්‍රය කදුරු පොත්තේ ඇඳ දොරකඩ එල්වා පන්නවනු. දබර වෙයි.[166]




**කලවා බන්ධනයයි**

ඒ ඕං මෝහිණීවත් කල මෝහිණී වාවා තාන් තීත්ත පෙරූ උත්තියවැලන්නී සොල්ලුඩා වර වරේශ්වා කා මේ මන්ත්‍රය යන්ත්‍රය ලියා උඩින් පන්වනුවා මඩේ ගසනය කලවා බන්ධනයයි.[167]

165 එම. ක. පත්තිරුව පත්තිරු කලුමැද නැත.

166 බෝගහවැව වශිගුරුකම් පොත. ක. පත්තිරුව.

167 එම.



**ඉනාබේත් වට්ටන්ට**

ඕං නමෝ සත්මුදෙන් ඒ දේසේ කිරි මුහුද මැද්දේ වාසස්ථාන කරන ගිනිසපුමල් දේවතාවා අහසට ගිනිකන්දක් ඇරියාය මංගර යකුන්ඩ ගිණිකදන් ඇරියාය හැටහතරක් සමයං අඩුන්තු ඇරියාය අසූහාරදාහක් ගිනි සුනියන් අංගං පිල්ලි එන ගිනිකඳට අසුවෙච්ච දච්ච පලච්ච නෙච්චවී නැත නැඟිට්වූ ගිණිසපුමල් දේවතාවා මමය- පැං මතුර ගාතු. ඉනා බේත් දී පැමිණෙන්නා වූ ලෙඩට බේත් දීපුවා වැටෙයි.[168]

**සමාලෝචන**

ඉහත දක්වන ලද කෙම් ක්‍රම ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ භාවිතව ඇත්තේ කිනම් සමයෙක සිට ද යන්න නිශ්චිත නැත. පූර්වෝක්ත නිදසුන් සියල්ල දැනට වසර සියයකට පසුව ලියනු ලැබ ඇති ඒවා බව විශ්වාස කළ හැකි ය. එයින් ද වඩාත් පැරණි වනුයේ පුස්කොළ ලේඛනවලට අයත් නිදසුන් ය. මේවා පරම්පරාවෙන් පරම්පරාවට පැවත එමින් තිබී යම් කලෙක අභාවිත වූ සේ පැනෙයි. පසු කලෙක මේවායේ වැදගත්කම දන්නා අය විසින් අනුලේඛන කරන ලදුව යම් ප්‍රමාණයක් මුද්‍රණයෙන් එළි දක්වා තිබීම පැසසිය යුතු වෙයි. දැන් මේ සියල්ල න-ස්පර්ශිත උරුම සාධකවලට අයත් වන්නේ ය. එකී දේ සංරක්ෂණය වනු පිණිසත්, රුචිකත් ව දක්වනු ලබන අයගේ දැන ගැනීම

168 සාරථී 9 කලාපය (2011).පි. 163.



පිණිසත් මෙ බඳු එක්රැස් කිරීම් කාලෝචිත දෙයක් විය හැකි ය. මේ සම්බන්ධ බොහෝ තොරතුරු විවිධ හේතු මත අභාවයට පත් ව ඇතැයි ද අනුමාන කළ හැකි ය. මේවා ගුප්ත විද්‍යාව සමඟ සම්බන්ධ ඒවා වන්නේ ය. අෂ්ටාංග ආයුර්වේදයේ එන ගුප්ත විද්‍යාව පුරාණයේ සිට පැවත එන විද්‍යාවකි. එයින් ඇතැම් කාරණා සම්බන්ධ ව ආරක්ෂාව සලසා ගැනීම සිදු ව ඇති අතර යම් යම් රෝග සන්සිඳුවා ගැනීම ද සිදුව ඇත. තවත් විටෙක හදිහූනියම්, වශී ගුරුකම් සහ ඉනාකර්ම ද සිදු කළ බවට සාධක තිබෙයි. හොඳ නරක දෙ ආකාරය සඳහා ම මේවා භාවිතව ඇති අයුරු විවිධ මූලාශ්‍රය අනුව පැහැදිලි ය. පොදුවේ බලන කල ලංකාවේ ක්‍රියාත්මක ආයුර්වේද සහ දේශීය වෛද්‍ය ක්‍රමය තුළත්, ද්‍රවිඩ, තෙළෙඟු, මලයාලම් මෙන් ම තවත් වෙදකම් හා ගුරුකම් තුළත් විවිධ කෙම් ක්‍රම පැවතිම පිළිගන්නා කරුණකි. මෙම අභිචාර විධික්‍රමවල සත්‍යාසත්‍ය බව සම්බන්ධයෙන් විවිධ අදහස් තිබිය හැකි ය. මේවායේ විද්‍යාත්මක හරය කුමක්දැ යි කෙනෙකුට තර්ක කිරීමට පුළුවන.

දේශීය දැනුම මෙන් ම ශ්‍රී ලාංකේය ජන විඥානය තුළ කාලාන්තරයක් තිස්සේ භාවිත කෙම් ක්‍රම ඇතුළු අභිචාර විධි පහසුවෙන් බැහැර කළ නොහැකි ය. ඇතැම් ඒවා සම්බන්යෙන් බුදු ගුණ භාවිත වීම සුළුපටු කරුණක් නො වෙයි. ලක්දිව ප්‍රාදේශීය විවිධතා අනුව මෙන්ම විවිධ සංස්කෘතික සාධක අනුව එකිනෙකට වෙනස් වූ බහු විෂයක උපයෝගිතා වෙනුවෙන් අනුගමනය කළ මේවා ඇගයීමත්, වහවහා තව ද සංරක්ෂණය කිරීමටත් උත්සුක වීම මැනවි. එය යුගයේ අවැසියාවකි. අනාගතය සඳහා සුරක්ෂිත කිරීම අපේ සංස්කෘතියෙන් බිඳක් මතු පරපුරට දායාද කිරීමක් වන්නේ ය. දේශීය කෙම් ක්‍රම ඇතුළු අභිචාර විධි රැකෙනු පිණිස කටයුතු කළ පැරණි සැවොම ස්තුති පූර්වක සිහිපත් කිරීම අපගේ යුතුකමකි. අනාගතය සඳහා සුරැකෙන පරිදි පිළියම් යෙදීම අදාළ අයගේ වගකීමකි.